# 8 ශ්‍රේණිය

# බුද්ධ ධර්මය

## ගුරු මාර්ගෝපදේශය

(2017 වසරේ සිට ක්‍රියාත්මක වේ.)

ආගම් හා සාරධර්ම අධ්‍යාපන දෙපාර්තමේන්තුව
**ජාතික අධ්‍යාපන ආයතනය**
මහරගම, ශ්‍රී ලංකාව


**Web|** www.nie.lk **Email|** info@nie.lk

# බුද්ධ ධර්මය

## ගුරු මාර්ගෝපදේශය

## 8 ශ්‍රේණිය

**(2017 වර්ෂයේ සිට ක්‍රියාත්මක වේ)**




**ආගම් හා සාරධර්ම අධ්‍යාපන දෙපාර්තමේන්තුව**

**ජාතික අධ්‍යාපන ආයතනය**

**මහරගම**

**ශ්‍රී ලංකාව**

වෙබ් අඩවිය : www.nie.lk

විද්‍යුත් තැපැල : info@nie.lk

# බුද්ධ ධර්මය
## ගුරු මාර්ගෝපදේශය
## 8 ශ්‍රේණිය

**(2017 වර්ෂයේ සිට ක්‍රියාත්මක වේ)**


**ආගම් හා සාරධර්ම අධ්‍යාපන දෙපාර්තමේන්තුව**

**ජාතික අධ්‍යාපන ආයතනය**

**ශ්‍රී ලංකාව**

වෙබ් අඩවිය : www.nie.lk

විද්‍යුත් තැපැල : info@nie.lk

බුද්ධ ධර්මය

8 ශ්‍රේණිය

ගුරු මාර්ගෝපදේශය

ප්‍රථම මුද්‍රණය 2017

C ජාතික අධ්‍යාපන ආයතනය

ISBN: ......................

ආගම් හා සාරධර්ම අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය
ශ්‍රී ලංකාව

වෙබ් අඩවිය : www.nie.lk
විද්‍යුත් තැපැල : info@nie.lk

මුද්‍රණය :

මුද්‍රණාලය
ජාතික අධ්‍යාපන ආයතනය

# අධ්‍යක්ෂ ජනරාල්තුමියගේ පණිවිඩය

ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නිර්දේශිත ජාතික අධ්‍යාපන අරමුණු සාක්ෂාත් කර ගැනීම සහ පොදු නිපුණතා සංවර්ධනය කිරීමේ මූලික අරමුණ සහිත ව එවකට පැවති අන්තර්ගතය පදනම් වූ විෂයමාලාව නවීකරණයට භාජනය කොට වර්ෂ අටකින් යුතු චක්‍රයකින් සමන්විත නව නිපුණතා පාදක විෂයමාලාවෙහි පළමු අදියර, වර්ෂ 2007 දී ජාතික අධ්‍යාපන ආයතනය විසින් ශ්‍රී ලංකාවේ ප්‍රාථමික හා ද්විතීයික අධ්‍යාපන ක්ෂේත්‍රයට හඳුන්වා දෙන ලදි.

පර්යේෂණවලින් අනාවරණය වූ කරුණු ද, අධ්‍යාපනය පිළිබඳ ව විවිධ පාර්ශ්වයන් ඉදිරිපත් කළ යෝජනා ද පදනම් කොට ගෙන සිදු කරන ලද විෂයමාලා තාර්කීකරණය කිරීමේ ක්‍රියාවලියක ප්‍රතිඵලයක් ලෙස විෂයමාලා චක්‍රයේ දෙවැනි අදියර අධ්‍යාපන ක්ෂේත්‍රයට හඳුන්වා දීම 2015 වසරේ  සිට ආරම්භ කර ඇත.

මෙම තාර්කීකරණ ක්‍රියාවලියේ දී සියලු ම විෂයයන්ගේ නිපුණතා පදනම් මට්ටමේ සිට උසස් මට්ටම දක්වා ක්‍රමානුකූල ව ගොඩනැගීම සඳහා පහළ සිට ඉහළට ගමන් කරන සිරස් සංකලනය භාවිත කර ඇති අතර විවිධ විෂයයන්හි දී එක ම විෂය කරුණු නැවත නැවත ඉදිරිපත් වීම හැකිතාක් අවම කිරීම, විෂය අන්තර්ගතය සීමා කිරීම සහ ක්‍රියාත්මක කළ හැකි ශිෂ්‍ය මිතුරු විෂයමාලාවක් සැකසීම සඳහා තිරස් සංකලනය ද භාවිත කර ඇත.

ගුරු භවතුන්ට පාඩම් සැලසුම් කිරීම, ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියෙහි සාර්ථක ව නිරත වීම, පන්ති කාමර මිනුම් හා ඇගයීම් ප්‍රයෝජනවත් පරිදි යොදා ගැනීම සඳහා අවශ්‍ය වන මාර්ගෝපදේශ ලබාදීමේ අරමුණින් නව ගුරු මාර්ගෝපදේශ හඳුන්වා දී ඇත. පන්ති කාමරය තුළ දී වඩාත් ඵලදායී ගුරුවරයෙකු ලෙස කටයුතු කිරීමට මෙම මාර්ගෝපදේශ උපකාරී වනු ඇත. සිසුන්ගේ නිපුණතා වර්ධනය කිරීම සඳහා ගුණාත්මක යෙදවුම් හා ක්‍රියාකාරකම් තෝරා ගැනීමට ගුරුවරුන්ට අවශ්‍ය නිදහස මෙමගින් ලබා දී තිබේ. එමෙන් ම නිර්දේශිත පාඨ ග්‍රන්ථවල ඇතුළත් වන විෂය කරුණු පිළිබඳ ව වැඩි බර තැබීමක් මෙම ගුරු මාර්ගෝපදේශවල අන්තර්ගත නොවේ. එම නිසා මෙම ගුරු මාර්ගෝපදේශය වඩාත් ඵලදායී වීමට නම් අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව විසින් සකසා ඇති අදාළ පාඨ ග්‍රන්ථ සමග සමගාමී ව භාවිත කිරීම අත්‍යාවශ්‍ය වේ.

තාර්කීකරණය කරන ලද විෂය නිර්දේශ, නව ගුරු මාර්ගෝපදේශ හා නව පාඨ ග්‍රන්ථවල මූලික අරමුණු වන්නේ ගුරු කේන්ද්‍රීය අධ්‍යාපන රටාවෙන් මිදී ශිෂ්‍ය කේන්ද්‍රීය අධ්‍යාපන රටාවක් හා වඩාත් ක්‍රියාකාරකම් මත පදනම් වූ අධ්‍යාපන රටාවකට එළඹීම මගින් වැඩ ලෝකයට අවශ්‍ය වන්නා වූ නිපුණතා හා කුසලතාවන්ගෙන් යුක්ත මානව සම්පතක් බවට ශිෂ්‍ය ප්‍රජාව සංවර්ධනය කිරීමයි.

නව විෂය නිර්දේශ සහ ගුරු මාර්ගෝපදේශ සම්පාදනය කිරීමේ දී ජාතික අධ්‍යාපන ආයතනයේ ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලයේ ද, ආයතන සභාවේ ද, රචනයේ දී දායකත්වය ලබා දුන් සියලු ම සම්පත්දායකයින් හා වෙනත් පාර්ශ්වයන්ගේ ද ඉමහත් කැපවීම ඇගයීමට ද මෙය අවස්ථාවක් කර ගනු කැමැත්තෙමි.

**ආචාර්ය ජයන්ති ගුණසේකර**
**අධ්‍යක්ෂ ජනරාල්**
**ජාතික අධ්‍යාපන ආයතනය**
**මහරගම**

# නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් හිමිගේ පණිවිඩය

ඉගෙනුම පුළුල් ක්ෂේත්‍රයක විහිද යන්නකි. එය ජීවිත අතිමහත් බවට ද, ඉතා ම සරල බවට ද පත් කරයි. මනුෂ්‍යයා ඉගෙනුම් කුසලතාවෙන් උත්කෘෂ්ට ය. මානව සමාජ සංවර්ධනය කේන්ද්‍ර කොට ගත් රටක්, සමාජයක් බුද්ධිය විසින් හඳුනා ගත් අසම්මතයන් බැහැර කිරීමට ද සුභාවිතයන් තුළින් නව ලොවක් නිර්මාණය කර ගැනීමට ද මෙවලම කර ගනු ලබන්නේ ඉගෙනුම යි.

ඉගෙනුම සඳහා වටිනා යමක් ද, ඉගෙනුම් ක්‍රමවේදයන් හා පහසුකම් ද අධ්‍යාපනය වටා නිර්මාණය විය යුතු ය. විෂය මාලාව, විෂය නිර්දේශය, මාර්ගෝපදේශ, සුසාධ්‍යකරුවන් ඉගෙනුම් ක්ෂේත්‍රයට එක්වනුයේ මේ ආකාරයෙනි.

නූතන ශ්‍රී ලංකාව ගෝලීය ප්‍රවණතාවන් මෙන් ම පුරාතන උරුමයන් ද සම්මිශ්‍රණය කර ගනිමින් ස්වීය අධ්‍යාපන රටාවක් හිමි කරගෙන ඇත. කාලීන අවශ්‍යතා මත ප්‍රතිසංස්කරණයන් තුළින් වසර අටකට වරක් යාවත්කාලීන වන විෂයමාලාවේ ඉගෙනුම් සම්පතක් ලෙස මෙම ගුරු මාර්ගෝපදේශ නිර්මාණය වේ.

විෂයයෙහි අරමුණුවල සංගතතාව ජාතික මට්ටමින් පවත්වා ගත යුතු ය. එහෙත් ගුරු මාර්ගෝපදේශයන් හි ඉගෙනුම් ක්‍රමවේදයන්, අකුරක්වත් වෙනස් නොකොට පිළිපැදිය යුත්තක් නම් නොවේ. විෂය නිර්දේශයෙහි නිපුණතා, නිපුණතා මට්ටම්, සාධනය වීම සඳහා අන්තර්ගතය තුළින් ඉගෙනුම් පල සම්ප්‍රාප්තිය පිණිස ඉගෙනුම් ක්‍රමවේද නිර්මාණශීලී ව වෙනස් කර ගැනීමට සුසාධ්‍යකරුවන්ට පැහැදිලිව ම ඉඩක් ඇති බව සඳහන් කරමි. ශිෂ්‍ය සාධන ප්‍රතිශතය ඉහළ මට්ටමකට ගැනීම සඳහා උදව් වන , පහසුකම් සලසන ගුරු භූමිකාවට කිසියම් ප්‍රවේශයක් සඳහා නිර්මාණය වන ගුරු මාර්ගෝපදේශය ශික්ෂකයාහට ද දෙගුරුනට ද භාවිත කළ හැක. අදාළ පෙළ පොතට සහකරුවකු වන ගුරු මාර්ගෝපදේශය තවත් පෙළ පොතක් නොවන බව දන ගුරුභවතුන් ගුරු මාර්ගෝපදේශය හා අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවේ සම්පාදිත අදාළ පෙළ පොත යන සම්පත් ද්‍රව්‍ය දෙක ම භාවිත කළ යුතු ය.

ඒ ඒ විෂයයන්හි සාධනය පිළිබඳ ඇගයීම් සිදු කරන ජාතික මට්ටමේ පරීක්ෂකවරයෙකු වුවද අපේක්ෂා කරන සාධනයන්, විෂය ඉගැන්වීමට මග පෙන්වන සුසාධ්‍යකරුවන් විසින් පාඩම අවසානයෙහි පන්ති කාමරයේ දී දරුවන් සමග ප්‍රත්‍යක්ෂකරණයට පත් විය යුතු ය. එම ඒකාත්මික වීම සඳහා වූ ප්‍රබෝධාත්මක සංස්කෘතියක් ගොඩනගා ගැනීමට ගුරු මාර්ගෝපදේශය පහුරක්, යාත්‍රාවක් කර ගනු ඇතැයි ආයාචනා පූර්වක ව අපේක්ෂා කරමි.

**ආචාර්ය මාඹුල්ගොඩ සුමනරතන හිමි**
**පීඨාධිපති, නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්**
**භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය**
**ජාතික අධ්‍යාපන ආයතනය.**

## විෂයමාලා කමිටුව

**උපදේශකත්වය හා අනුමැතිය** : ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලය
ජාතික අධ්‍යාපන ආයතනය

**විෂය සම්බන්ධීකරණය** : **ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය** පූජ්‍ය උඩුගම සුදස්සී හිමි
දෙපාර්තමේන්තු ප්‍රධාන

**විෂය විශේෂඥ උපදෙස්** :

- විශ්‍රාමික කථිකාචාර්ය පූජ්‍ය ගන්තුනේ අස්සජී මහා නායක මාහිමිපාණන් වහන්සේ, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, නුගේගොඩ.
- මහාචාර්ය පූජ්‍ය දේවාලේගම මේධානන්ද හිමි, කැලණිය විශ්වවිද්‍යාලය, කැලණිය.

**ලේඛක මණ්ඩලය** :

- ජාතික අධ්‍යාපන ආයතනයේ, ආගම් හා සාරධර්ම අධ්‍යාපන දෙපාර්තමේන්තු ප්‍රධානි, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය පූජ්‍ය උඩුගම සුදස්සී හිමි
- ජාතික අධ්‍යාපන ආයතනයේ විශ්‍රාමික කථිකාචාර්ය, එස්. පී. විතාන මහතා
- බප/ජය/ඉහළ බෝමිරිය කනිටු විදුහලේ විදුහල්පති උදයරුවන් මල්ලිකාරච්චි මහතා
- පිළියන්දල අධ්‍යාපන කලාපයේ ගුරු උපදේශක එල්. එන්. ඒ. වීරසිංහ මහතා
- රත්නපුර අධ්‍යාපන කලාපයේ ගුරු උපදේශක වයි. පී. පී. කවිසිගමුව මහත්මිය

**සංස්කරණය** :

- ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය පූජ්‍ය උඩුගම සුදස්සී හිමි, දෙපාර්තමේන්තු ප්‍රධාන, ආගම් හා සාරධර්ම අධ්‍යාපන දෙපාර්තමේන්තුව, ජාතික අධ්‍යාපන ආයතනය.
- ඩබ්ලිව්. කරුණාරත්න මහතා, කථිකාචාර්ය, ගුරු මධ්‍යස්ථානය, ගිරාගම, පිළිමතලාව.

**පරිගණක වදන් සැකසුම** :

මංගලිකා විජේරත්න, කළමනාකරණ සහකාර 1, ජාතික අධ්‍යාපන ආයතනය

**කාර්යාලයීය කටයුතු** : එස්. සී. ප්‍රියදර්ශනී මහත්මිය
ජාතික අධ්‍යාපන ආයතනය

ඩයස් අමරසිංහ මහතා
ජාතික අධ්‍යාපන ආයතනය

## ගුරු මාර්ගෝපදේශය පරිශීලනය කිරීම සඳහා උපදෙස්

බෞද්ධාගමික ඉගැන්වීම්වලට අනුකූල ව සාර්ථක පෞද්ගලික හා සමාජීය ජීවිතයක් පවත්වා ගැනීමට උපකාරී වන පරිදි, අත්‍යවශ්‍ය නිපුණතා පාදක කොට ගෙන, පාසල් අධ්‍යාපනය හරහා එකී නිපුණතා සංවර්ධනය කර ගැනීම උදෙසා මගපෙන්වීමට මෙම ගුරු මාර්ගෝපදේශය සකස් කර ඇත.

දැනුමින් පමණක් පෝෂිත ව, දැනුම් කේන්ද්‍රීය විභාග ක්‍රමයක් යටතේ ඉහළ සාමර්ථ්‍යයක් ලැබුව ද සැබවින් ම පුද්ගලයකුගේ ජීවිතයේ සාර්ථකත්වය උදෙසා එය ප්‍රමාණවත් නො වේ. විධිමත් අධ්‍යාපන ක්‍රියාවලිය මගින් ශිෂ්‍ය ප්‍රජාවගේ හිස මෙන් ම හද හා අත ද නිසිලෙස හැසිරවීම අත්‍යවශ්‍ය වේ. මෙම අරමුණු සාක්ෂාත් කර ගැනීම ගුරු මාර්ගෝපදේශය සම්පාදනයේ දී අපේක්ෂා කර ඇත.

පාඩමක ඵලදායිතාව සඳහා ප්‍රවේශය වඩාත් වැදගත් වන බැවින් ප්‍රබෝධාත්මක ආරම්භයක් ලබා දීම වැදගත් වේ. පාඩමේ සංවර්ධනයට අදාළ කරගත හැකි යෙදවුම්, ගුණාත්මක යෙදවුම් යන්නෙන් අදහස් කෙරේ.

- පාඩමට අදාළ ව සංයුක්ත තැටි, පරිගණකය, බහු මාධ්‍ය ප්‍රක්ෂේපණ යන්ත්‍ර ආදිය භාවිත කිරීම (Multi Media)
- චිත්‍ර , ගීත, පුවත් පත්, සඟරා, ඇටවුම්, ප්‍රතිමා, මූර්ති, කැටයම්, ඡායාරූප වැනි දෑ යොදා ගැනීම
- පෙළ පොත, ලියන පුවරුව, කඩදාසි, විවිධ වර්ණ ඇතුළත් තීන්ත පෑන්, චලන රූප, කාන්දම් රඳවනය, පැනල් පුවරුව ආදිය භාවිත කිරීම
- අදාළ කරගත හැකි වෙනත් සම්පත් උපකාර කර ගැනීම

කණ්ඩායම් ක්‍රියාකාරකමක දී ශිෂ්‍ය කණ්ඩායමක සිටිය යුතු ප්‍රශස්ත සංඛ්‍යාව 07ක් ලෙස සැලකෙන බැවින් ඊට ගැළපෙන පරිදි සංවිධානය වීම වැදගත් ය. ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ දී ඊට වඩාත් සුදුසු ස්ථානය තෝරා ගැනීමට ගුරුවරයා උනන්දු විය යුතු ය. (උදා. විහාරස්ථානය, පාසලේ බුදු මැදුර, රුක් සෙවණ) පාඩමට (ක්‍රියාකාරකමට) පිවිසීමේ දී ප්‍රබෝධාත්මක ආරම්භය, පෙර අත්දැකීම් හා පාඩම පිළිබඳ කුතුහලය යන කරුණු ගැන සැලකිලිමත් වෙමින් ප්‍රදේශයේ සංස්කෘතික පසුබිම කෙරෙහි ද අවධානය යොමු කළ යුතු ය. ශ්‍රද්ධාව ජනනය වන පරිදි ශාසනික වචන භාවිතය පිළිබඳ සැලකිලිමත් වන්න.

මෙහි ඇතුළත් පාඩම්වලට යෝජිත ඉගෙනුම්- ඉගැන්වීම් ක්‍රියාවලිය භාවිත කිරීම අනිවාර්ය නොවන අතර විකල්ප ඉගෙනුම් ක්‍රම, සුදුසු පරිදි භාවිත කළ හැකි ය. එහෙත් නිපුණතාව හා නිපුණතා මට්ටමෙන් බැහැර නොවිය යුතු ය. ඉගෙනුම් -ඉගැන්වීම් ක්‍රියාවලියේ දී යහපත් ආගමික ආකල්ප වර්ධනය කෙරෙහි ද ප්‍රායෝගික අවස්ථා යොදා ගැනීම කෙරෙහි ද වැඩි අවධානයක් යොමු කරන්න.

පාඩම ආරම්භයේ සිට අවසානය දක්වා තක්සේරුව සිදු කළ යුතු අතර හැකියා නොහැකියා අනුව ප්‍රතිපෝෂණය හා ඉදිරි පෝෂණය ලබා දිය යුතු ය. කණ්ඩායම් ගවේෂණ ක්‍රියාවලියෙන් අනාවරණය කර ගන්නා ඉගෙනුම් පල අභ්‍යාස පොත්වල කෙටියෙන් සටහන් කර ගැනීමට සිසුන්ට උපදෙස් දෙන්න. බොහෝ විට කාල සටහන් සැකසීමේ දී කාලච්ඡේද දෙකක් එකවර නොලැබෙනු ඇත. එබැවින් අදාළ පාඩම කළමනාකරණය කර ගැනීම ඔබ සතු වගකීමකි. අදාළ පාඩමට අපේක්ෂිත ඇගයුම, තක්සේරුව හා ඇගයීම් නිර්ණායක අනුව සකස් කර ගන්න. ඔබ විසින් සිසුන්ට ලබා දෙන ලද අභ්‍යාසවල නිරවද්‍යතාව පරීක්ෂා කොට සටහන් තබන්න.

සෑම පාඩම් සටහනක් අවසානයේ ම යොදා ඇති ගෙදර පරිසරයෙන් යන කොටස දෙමාපිය වැඩිහිටි සහභාගිත්වය යටතේ සිදු කිරීමට යෝජිත ය. ඒ සඳහා අදාළ උපදෙස්, විදුහල්පති විසින් පාසල් සංවර්ධන සමිතියේ දී ද, විෂය භාර ගුරුභවතා විසින් පන්ති කවවල දී ද දෙමාපියන්ට හා වැඩිහිටියන්ට ලබා දීමට කටයුතු කළ යුතු ය.

**ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය**
**ශාස්ත්‍රපති පූජ්‍ය උඩුගම සුදස්සී හිමි**
**දෙපාර්තමේන්තු ප්‍රධානි**

| පටුන | පිටුව |
|---|---|
| අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ පණිවිඩය | i |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් හිමිගේ පණිවිඩය | ii |
| විෂයමාලා කමිටුව | iii |
| ගුරු මාර්ගෝපදේශය පරිශීලනය සඳහා උපදෙස් | iv |
| විෂය නිර්දේශයේ අන්තර්ගතය | vii |
| ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා උපදෙස් | 1-47 |

# විෂය නිර්දේශයේ අන්තර්ගතය

## විෂය හැඳින්වීම

බුදු දහමෙහි විෂය කරුණු ප්‍රායෝගිකත්වයට නැඹුරු කරවීම අන් කවර යුගයකටත් වඩා වර්තමානයේ අත්‍යවශ්‍ය ව පවතී. හුදු වනපොත්කරණයෙන් හා දහම් කරුණු හැදෑරීමෙන් ඔබ්බට ගොස් දෛනික ජීවිතයේ මුහුණ දීමට සිදු වන විවිධ ගැටලුවල දී ඒවාට සාර්ථක ව මුහුණ දීම සඳහා දහම් කරුණු භාවිතයට නැඹුරු කරවීම අතිශය වැදගත් වේ.

බුද්ධ ධර්මය විෂය සඳහා පාසල් කාලසටහනෙහි වෙන් වී ඇත්තේ සතියකට කාලච්ඡේද දෙකක් වුව ද එම කාලය වඩාත් අර්ථවත් ව හා ඵලදායී ව යොදා ගැනීම දහම් ගුරු භවතාගේ වගකීමකි. සමබර පෞරුෂයකින් හෙබි පුරවැසියකු බිහි කිරීම සඳහා බුද්ධ ධර්මය විෂය නිර්දේශයෙහි දැක්වෙන නිපුණතා අත්පත් කර ගැනීමට මහෝපකාරී වේ.

නව සහස්‍රකයේ පළමු විෂයමාලා ප්‍රතිසංස්කරණයෙහි අත්දැකීම් ද පාදක කොට ගනිමින් වඩාත් ගුණාත්මක පරිවර්තනයක් ඇති කිරීමටත් දෛනික ජීවිතයේ දී සැබෑ බෞද්ධයකු ලෙස දරුවාට කටයුතු කිරීමටත්, විචාරශීලී මනසකින් හෙබි දැහැමි පුද්ගලයකු බිහිකිරීමටත් විෂය නිර්දේශය මග පාදනු ඇතැයි අපේක්ෂා කෙරේ.

6 ශ්‍රේණියේ සිට 11 ශ්‍රේණිය තෙක් විෂය නිර්දේශය පොදු නිපුණතා 10කින් සමන්විත වන අතර, ඒ ඒ ශ්‍රේණියට ගැළපෙන නිපුණතා මට්ටම්වලින් ද එම නිපුණතා මට්ටම් සාක්ෂාත් කර ගැනීමට වඩාත් උචිත විෂය සන්ධාරයකින් ද සමන්විත ය. ඉගෙනුම් ඉගැන්වීම් කාර්යයේ දී නිපුණතා මට්ටම් කෙරෙහි වැඩි අවධානයක් යොමු කොට එම නිපුණතා මට්ටම් සාක්ෂාත් කර ගත හැකි පරිදි විෂය සන්ධාරයට අදාළ කරුණු හරවත් ව පෙළගස්වා, සිසුන්ට ඉදිරිපත් කළ යුතු වේ. මෙම විෂය නිර්දේශයෙන් සැබවින් ම දරුවා සක්‍රීය ඉගෙනුමක් කරා ගෙන යාමටත් වඩාත් ප්‍රත්‍යක්ෂකරණයකට යොමු කිරීමෙන් දරුවන් තුළ දැහැමි බව වර්ධනය කිරීමටත් අපේක්ෂා කරනු ලැබේ. හැකි තරම් ප්‍රායෝගික අත්දැකීම්වලින් නිපුණතා මට්ටම් සාක්ෂාත් කර ගැනීමට සංවිධානය කිරීම ගුරුභවතුන් ඇතුළු විෂය භාර සියලු දෙනාගේ වගකීම වේ.

## ජාතික අධ්‍යාපන පද්ධතිය සඳහා අරමුණු

### ජාතික අරමුණු

පුද්ගලයාට හා සමාජයට අදාළ වන ප්‍රධාන ජාතික අරමුණු කරා ළඟා වීම සඳහා පුද්ගලයින්ට සහ කණ්ඩායම්වලට ජාතික අධ්‍යාපන පද්ධතිය සහාය විය යුතුය. වසර ගණනාවක් මුළුල්ලේ ශ්‍රී ලංකාවේ ප්‍රධාන අධ්‍යාපන වාර්තා සහ ලේඛන මගින් පුද්ගල හා ජාතික අවශ්‍යතාවන් සපුරාලීම සඳහා අරමුණු නියම කරනු ලැබීය. සමකාලීන අධ්‍යාපන ව්‍යුහයන් හා ක්‍රියාවලීන් තුළ දැකිය හැකි දුර්වලතා නිසා ධරණීය මානව සංවර්ධන සංකල්ප රාමුව ඇතුළත අධ්‍යාපනය තුළින් ළඟාකර ගත යුතු පහත දැක්වෙන අරමුණු ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් හඳුනා ගෙන ඇත. මෙම අරමුණු සපුරා ගැනීම අධ්‍යාපන පද්ධතිය සඳහා වූ තම ඉදිරි දැක්ම ලෙසට ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් ප්‍රත්‍යක්ෂ කොට ගෙන ඇත.

1. මානව අභිමානයට ගරු කිරීමේ සංකල්පය මත පිහිටා ශ්‍රී ලාංකික බහුවිධ සමාජයේ සංස්කෘතික විවිධත්වය අවබෝධ කර ගනිමින් ජාතික ඒකාබද්ධතාව, ජාතික ඍජු ගුණය, ජාතික සමගිය, එකමුතුකම සහ සාමය ප්‍රවර්ධනය කිරීම තුළින් ජාතිය ගොඩනැගීම සහ ලාංකීය අනන්‍යතාව තහවුරු කිරීම.
2. වෙනස් වන ලෝකයක අභියෝගයන්ට ප්‍රතිචාර දක්වන අතර ජාතික උරුමයේ මාහැඟි දායාදයන් හඳුනා ගැනීම සහ සංරක්ෂණය කිරීම.
3. මානව අයිතිවාසිකම්වලට ගරු කිරීම, යුතුකම් හා වගකීම් පිළිබඳ දැනුවත් වීම, හෘදයාංගම බැඳීමකින් යුතු ව එකිනෙකා කෙරෙහි සැලකිලිමත් වීම යන ගුණාංග වර්ධනය කිරීමට ඉවහල් වන සමාජ සාධාරණත්ව සම්මතයන් සහ ප්‍රජාතාන්ත්‍රික ජීවන රටාවක් ගැබ් වූ පරිසරයක් නිර්මාණය කිරීම සහ පවත්වා ගෙන යාමට සහාය වීම.
4. පුද්ගලයින්ගේ මානසික හා ශාරීරික සුව සම්පත සහ මානව අගයයන්ට ගරු කිරීම මත පදනම් වූ තිරසාර ජීවන ක්‍රමයක් ප්‍රවර්ධනය කිරීම.
5. සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාණ හැකියාව, ආරම්භක ශක්තිය, විචාරශීලී චින්තනය, වගකීම හා වගවීම ඇතුළු වෙනත් ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය කිරීම.
6. පුද්ගලයාගේ සහ ජාතියේ ජීව ගුණය වැඩිදියුණු කෙරෙන සහ ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනය සඳහා දායක වන ඵලදායී කාර්යයන් සඳහා අධ්‍යාපනය තුළින් මානව සම්පත් සංවර්ධනය කිරීම.
7. ශීඝ්‍රයෙන් වෙනස් වන ලෝකයක් තුළ සිදු වන වෙනස්කම් අනුව හැඩගැසීමට හා ඒවා පාලනය කර ගැනීමට පුද්ගලයන් සූදානම් කිරීම සහ සංකීර්ණ හා අනපේක්ෂිත අවස්ථාවන්ට සාර්ථක ව මුහුණ දීමේ හැකියාව වර්ධනය කිරීම.
8. ජාත්‍යන්තර ප්‍රජාව අතර ගෞරවනීය ස්ථානයක් හිමි කර ගැනීමට දායක වන යුක්තිය, සමානත්වය සහ අන්‍යෝන්‍ය ගරුත්වය මත පදනම් වූ ආකල්ප හා කුසලතා පෝෂණය කිරීම.

## මූලික නිපුණතා

අධ්‍යාපනය තුළින් වර්ධනය කෙරෙන පහත දැක්වෙන මූලික නිපුණතා ඉහත සඳහන් ජාතික අරමුණු මුදුන් පත් කර ගැනීමට දායක වනු ඇත.

1. **සන්නිවේදන නිපුණතා**

   සාක්ෂරතාව, සංඛ්‍යා පිළිබඳ දැනුම, රූපක භාවිතය සහ තොරතුරු තාක්ෂණ ප්‍රවීණත්වය යන අනු කාණ්ඩ 4ක් මත සන්නිවේදන නිපුණතා පදනම් වේ.

   **සාක්ෂරතාව** සාවධාන ව ඇහුම්කන් දීම, පැහැදිලි ව කථා කිරීම, තේරුම් ගැනීම සඳහා කියවීම, නිවැරදි ව සහ නිරවුල් ව ලිවීම, ඵලදායී අයුරින් අදහස් හුවමාරු කර ගැනීම

   **සංඛ්‍යා පිළිබඳ දැනුම** භාණ්ඩ, අවකාශය සහ කාලය, ගණන් කිරීම, ගණනය සහ මිනුම් සඳහා ක්‍රමානුකූල ඉලක්කම් භාවිතය

   **රූපක භාවිතය** රේඛා සහ ආකෘති භාවිතයෙන් අදහස් පිළිබිඹු කිරීම සහ රේඛා, ආකෘති හා වර්ණ ගළපමින් විස්තර, උපදෙස් හා අදහස් ප්‍රකාශනය හා වාර්තා කිරීම

   **තොරතුරු තාක්ෂණ ප්‍රවීණත්වය** පරිගණක දැනුම සහ ඉගෙනීමේ දී ද, සේවා පරිශ්‍රයන් තුළ දී ද, පෞද්ගලික ජීවිතයේ දී ද තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය උපයෝගී කර ගැනීම.

2. **පෞරුෂත්ව වර්ධනයට අදාළ නිපුණතා**

   - නිර්මාණශීලී බව, අපසාරී චින්තනය, ආරම්භක ශක්තිය, තීරණ ගැනීම, ගැටලු නිරාකරණය කිරීම, විචාරශීලි හා විග්‍රහාත්මක චින්තනය, කණ්ඩායම් හැඟීමෙන් කටයුතු කිරීම, පුද්ගලාන්තර සබඳතා, නව සොයා ගැනීම් සහ ගවේෂණය වැනි වර්ගීය කුසලතා
   - ඍජු ගුණය, ඉවසා දරා සිටීමේ ශක්තිය සහ මානව අභිමානයට ගරු කිරීම, වැනි අගයයන්
   - චිත්තවේගී බුද්ධිය

3. **පරිසරයට අදාළ නිපුණතා**

   මෙම නිපුණතා සාමාජික, ජෛව සහ භෞතික පරිසරයන්ට අදාළ වේ.

   **සමාජ පරිසරය** ජාතික උරුමයන් පිළිබඳ අවබෝධය, බහුවාර්ගික සමාජයක සාමාජිකයන් වීම හා සම්බන්ධ සංවේදීතාව හා කුසලතා, සාධාරණ යුක්තිය පිළිබඳ හැඟීම, සමාජ සම්බන්ධතා, පුද්ගලික චර්යාව, සාමාන්‍ය හා නෛතික සම්ප්‍රදායයන්, අයිතිවාසිකම්, වගකීම්, යුතුකම් සහ බැඳීම්

   **ජෛව පරිසරය** සජීවී ලෝකය, ජනතාව සහ ජෛව පද්ධතිය, ගස් වැල්, වනාන්තර, මුහුදු, ජලය, වාතය සහ ජීවය - ශාක, සත්ත්ව හා මිනිස් ජීවිතයට සම්බන්ධ වූ අවබෝධය, සංවේදී බව හා කුසලතා

   **භෞතික පරිසරය** අවකාශය, ශක්තිය, ඉන්ධන, ද්‍රව්‍ය, භාණ්ඩ සහ මිනිස් ජීවිතයට ඒවායේ ඇති සම්බන්ධතාව, ආහාර, ඇඳුම්, නිවාස, සෞඛ්‍ය, සුව පහසුව, ශ්වසනය, නින්ද, නිස්කලංකය, විවේකය, අපද්‍රව්‍ය සහ මළපහ කිරීම යනාදිය හා සම්බන්ධ වූ අවබෝධය, සංවේදීතාව හා කුසලතාව ඉගෙනීම, වැඩ කිරීම සහ ජීවත් වීම සඳහා මෙවලම් හා තාක්ෂණය ප්‍රයෝජනයට ගැනීමේ කුසලතා මෙහි අඩංගු වේ.

4. **වැඩ ලෝකයට සූදානම් වීමේ නිපුණතා**
ආර්ථික සංවර්ධනයට දායක වීම. තම වෘත්තීය ළැදියා සහ අභියෝග්‍යතා හඳුනා ගැනීම. හැකියාවන්ට සරිලන අයුරින් රැකියාවක් තෝරා ගැනීම සහ වාසිදායක හා තිරසාර ජීවනෝපායක නිරත වීම. යන හැකියාවන් උපරිම කිරීමට හා ධාරිතාව වැඩි කිරීමට අදාළ සේවා නියුක්තිය හා සම්බන්ධ කුසලතා.

5. **ආගම සහ ආචාර ධර්මයන්ට අදාළ නිපුණතා**
පුද්ගලයන්ට තම දෛනික ජීවිතයේ දී ආචාර ධර්ම, සදාචාරාත්මක හා ආගමානුකූල හැසිරීම් රටාවන්ට අනුගත වෙමින් වඩාත් උචිත දේ තෝරා එයට සරිලන සේ කටයුතු කිරීම සඳහා අගයයන් උකහා ගැනීම හා ස්වීයකරණය.

6. **ක්‍රීඩාව හා විවේකය ප්‍රයෝජනයට ගැනීමේ නිපුණතා**
සෞන්දර්යය, සාහිත්‍යය, සෙල්ලම් කිරීම, ක්‍රීඩා හා මලල ක්‍රීඩා, විනෝදාංශ හා වෙනත් නිර්මාණාත්මක ජීවන රටාවන් තුළින් ප්‍රකාශ වන විනෝදය, සතුට, ආවේග සහ එවන් මානුෂික අත්දැකීම්.

7. **ඉගෙනීමට ඉගෙනුම් පිළිබඳ නිපුණතා**
ශීඝ්‍රයෙන් වෙනස් වන, සංකීර්ණ හා එකිනෙකා මත යැපෙන ලෝකයක පරිවර්තන ක්‍රියාවලියක් හරහා වෙනස්වීම් හසුරුවා ගැනීමේ දී හා ඊට සංවේදී ව හා සාර්ථක ව ප්‍රතිචාර දැක්වීමත් ස්වාධීන ව ඉගෙන ගැනීමත් සඳහා පුද්ගලයින් හට ශක්තිය ලබා දීම.

ඉහත ජාතික අරමුණු හා මූලික නිපුණතා ශ්‍රී ලංකාවේ සාමාන්‍ය අධ්‍යාපනය පිළිබඳ ප්‍රතිපත්ති රාමුවක් සඳහා යෝජනා ඇතුළත් ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ 2003 දෙසැම්බර් වාර්තාවෙන් උපුටා ගැනිණ.

## විෂයයේ අරමුණු

(1) ත්‍රිවිධ රත්නයේ ගුණ හැඳින, ශ්‍රද්ධාවෙන් කටයුතු කරන, නිවැරදි ව ප්‍රායෝගික වතාවත්වල යෙදෙන දැහැමි දරු පරපුරක් බිහිකිරීම.

(2) ජීවන ගමනේ දී මුහුණ දෙන අභියෝග ජය ගැනීමට සහ නිවැරදි ජීවන දර්ශනයක් ගොඩනගා ගැනීමට බුදු දහමෙහි මූලික ඉගැන්වීම් උපයෝග කර ගැනීම පිණිස දරු පරපුරට මගපෙන්වීම.

(3) යහපත් පෞරුෂයක් ගොඩනගා ගැනීම උදෙසා බෝසත් චරිතය, බුද්ධ චරිතය හා සිවුවනක් පිරිසට අයත් ශ්‍රේෂ්ඨ චරිත ආදර්ශ කොට ගැනීම සඳහා මගපෙන්වීම.

(4) ශ්‍රී ලාංකික උරුමය දායාද කොට ගත් අභිමානවත්, වගකීමෙන් සහ වගවීමෙන් යුතු දරු පරපුරක් ගොඩනගා ගැනීම.

(5) සිය ජීවන දර්ශනය ගොඩනගා ගැනීමේ දී ධම්මපද දේශනා සහ බෞද්ධ උපදේශ කාව්‍ය පදනම් කරගත් ඉගැන්වීම් චරිතායනයට මගපෙන්වීම.

(6) මානසික ඒකාග්‍රතාවෙන් යුතු සුසමාහිත පෞරුෂයක් ගොඩනගා ගැනීම සඳහා භාවනාව ප්‍රගුණ කිරීමට යොමු කරවීම.

(7) බෞද්ධ ශිෂ්ටාචාරයෙහි සුවිශේෂ අංග අධ්‍යයනය කොට, සහජීවනයෙන් කටයුතු කරන සිය අනන්‍යතාව රැක ගත් දරු පරපුරක් ගොඩනගා ගැනීම.

## විෂය නිර්දේශය

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 1.0 තෙරුවන ගුණ හැඳින චරිතායනය කරයි. | 8.1.1 **බුද්ධ චරිතයෙහි සුවිශේෂී අවස්ථා අධ්‍යයනය කර ජීවිතය හැඩගසා ගැනීමට ක්‍රියා කරයි.** | • දේවදත්ත හිමිගේ පංචවර යාචනය,කාන්තාවන්ට පැවිද්ද ලබාදීම, චුල්ලපන්ථක හිමිට දහම් දෙසීම, නන්ද හිමිගේ කථා පුවත | • බුදුරජාණන් වහන්සේ විසින් ගැටලු සහගත අවස්ථා විසඳූ ආකාරය පිළිබඳ නිදසුන් සපයයි.<br>• ඕනෑම ගැටලුවකට විසඳුම් ඇති බව පිළිගනියි.<br>• ගැටලුවක් විසඳන ආකාරය නාට්‍යානුසාරයෙන් රඟ දක්වයි.<br>• ගැටලු විසඳා ගනියි.<br>• නිවැරදි තීරණ ගනියි. | 02 |
| | 8.1.2 **බුදු සිරිතේ ආචාරශීලී ගුණාංග ඇසුරෙන් තම සමාජ ජීවිතය හැඩ ගසා ගනියි.** | • බුද්ධ චරිතයෙන් ප්‍රකට වන සමාජ ආචාර ධර්ම (ආගන්තුක සත්කාරය, අනතිමානී බව, අල්ප ශබ්දතාව, සුහදශීලී කථාබහ, මහජන මතයට ගරු කිරීම) | • බුදු සිරිතෙන් ප්‍රකට වන සමාජ ආචාර ධර්ම පැහැදිලි කරයි.<br>• සමාජයේ යහපැවැත්මට ආචාර ධර්ම හේතු වන බව පිළිගනියි.<br>• සමාජ ආචාර ධර්ම ලැයිස්තු ගත කරයි.<br>• සමීපතමයන්ට මිත්‍රශීලී වෙයි.<br>• ආචාරශීලී ව කටයුතු කරයි. | 02 |
| | 8.1.3 **ස්වාක්ඛාතෝ පාඨයෙහි ඇතුළත් දහම් ගුණ හැඳින විචාරශීලී ව කටයුතු කරයි.** | • ධර්ම රත්නයේ ගුණ | • ධර්ම රත්නයේ ගුණ අනුපිළිවෙළින් පැහැදිලි කරයි.<br>• දහම් ගුණ ජීවමාන බව පිළිගනියි.<br>• ''ස්වාක්ඛාතෝ'' පාඨය නිවැරදි ව මතකයෙන් සජ්ඣායනය කරයි.<br>• විචාරශීලී ව කටයුතු කරයි.<br>• ධර්මානුකූලව ජීවත් වෙයි. | 02 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 2.0<br>ජීවන රටාව හැඩ ගසා ගැනීමට බෞද්ධ ඉගැන්වීම් හා ශ්‍රාවක ශ්‍රාවිකා චරිත උපයෝග කර ගනියි. | 8.2.1<br>**බෞද්ධ සිරිත් විරිත්හි පෞද්ගලික හා සමාජීය වටිනාකම දැන ඒවා ආදර්ශනය කරයි.** | • ජීවිතයෙහි අනුස්මරණීය අවස්ථාවන්හි දී බෞද්ධ සිරිත් විරිත් අනුගමනය කිරීමේ වැදගත්කම | • ජීවිතයේ වැදගත් අවස්ථාවන්ට උචිත බෞද්ධ සිරිත් විරිත් නම් කරයි.<br>• බෞද්ධ සිරිත් විරිත් අනුගමනයෙන් ආචාරසම්පන්න සමාජයක් බිහි වන බව පිළිගනියි.<br>• බෞද්ධ සිරිත් විරිත් කිහිපයක් නාට්‍යානුසාර-යෙන් නිරූපණය කරයි.<br>• ජීවිතයේ වැදගත් අවස්ථාවන්හි බෞද්ධ සිරිත් විරිත් කෙරෙහි සැලකිලිමත් වෙයි.<br>• බෞද්ධ සිරිත් විරිත් අනුගමනය කරයි. | 02 |
| | 8.2.2<br>**බුද්ධානුස්සති භාවනාව ඇසුරෙන් බුදු ගුණ දැක ශ්‍රද්ධාවෙන් ක්‍රියා කරයි.** | • බුද්ධානුස්සති භාවනාව | • බුදුගුණ භාවනාවේ යෙදෙන අයුරු තම වචනයෙන් පවසයි.<br>• බුදුගුණ භාවනාවෙහි ආනිශංස රැසක් ඇති බව පිළිගනියි.<br>• නිවැරදි ව බුදුගුණ භාවනාවේ යෙදෙයි.<br>• දෛනික ව භාවනා කරයි.<br>• ශ්‍රද්ධාවෙන් ක්‍රියා කරයි. | 02 |
| | 8.2.3<br>**ශ්‍රාවක චරිත ආදර්ශයට ගෙන තම ජීවිතය හැඩ ගසා ගනියි.** | • සැරියුත් සහ මුගලන් මහරහතන් වහන්සේලාගේ චරිත | • සැරියුත්, මුගලන් මහරහතන් වහන්සේලාගේ චරිතාපදාන ගෙනහැර දක්වයි.<br>• සැරියුත්, මුගලන් දෙනම වහන්සේලාගේ චරිතවලින් ජීවිතාදර්ශ ලැබිය හැකි බව පිළිගනියි.<br>• සැරියුත් මුගලන් මහරහතන් වහන්සේලාගේ චරිතයන්හි වැදගත් සිදුවීම් හා ආදර්ශ වගුගත කරයි.<br>• ආදර්ශවත් පුද්ගලයන්ට ගරු බුහුමන් දක්වයි.<br>• සත්පුරුෂ ලක්ෂණ ප්‍රදර්ශනය කරයි. | 02 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | **8.2.4 ධම්මපද ගාථා ඇසුරින් තම ජීවන දර්ශනය හැඩගසා ගැනීමට ක්‍රියා කරයි.** | •"යෝ ච පුබ්බේ පමජ්ජිත්වා'' සහ ''යස්ස පාපං කතං කම්මං'' යන ධම්ම පද ගාථා දෙක | • ධම්ම පද ගාථා දෙකෙහි සරල අරුත පවසයි.<br>• වැරදි කළ අයකුට වුවද කළ වරද තේරුම් ගෙන යහපතෙහි පිහිටා නිවරදි පුද්ගලයකු විය හැකි බව පිළිගනියි.<br>• ධම්ම පද ගාථා දෙක නිවැරදි ව මතකයෙන් සජ්ඣායනය කරයි.<br>• ක්‍රියාවට පෙර ප්‍රතිඵල පිළිබඳ සැලකිලිමත් වෙයි.<br>• තම වැරදි නිවැරදි කර ගනියි. | 02 |
| | **8.2.5 තම ආචාර ධර්ම ගොඩනගා ගැනීමට භික්ෂු විනයේ එන සේඛියා ධර්ම අදාළ පරිදි උපයෝග කර ගනියි.** | සේඛියා ධර්ම (පරිමණ්ඩල වග්ග, කබල වග්ග, සුරු සුරු වග්ග) | • ''සේඛියා ධර්ම'' යන්න පැහැදිලි කරයි.<br>• කථා බහ, ඇඳුම, ගමන බිමන ආචාරශීලී විය යුතු බව පිළිගනියි.<br>• සේඛියා ධර්ම ඇසුරෙන් ආචාර ධර්ම ලේඛනයක් සකස් කරයි.<br>• දෛනික ජීවිතයේ දී ආචාර ධර්ම පිළිපදියි.<br>• ප්‍රියශීලී පුද්ගලයකු වෙයි. | 02 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 3.0 බෞද්ධ සාරධර්ම අගය කරමින් පිළිපදියි. | 8.3.1අෂ්ටාංග උපෝසථ සීලය හා දස සීලය අගයන සහ සුරකින සමාජයක් ගොඩනැගීමට දායක වෙයි. | • අෂ්ටාංග උපෝසථ සීලයෙහි හා දස සීලයෙහි ඇති හරවත් බව හා ප්‍රායෝගික බව | • අෂ්ටාංග උපෝෂථ සීලය හා දස සීලය නම් කරයි.<br>• අෂ්ටාංග උපෝෂථ ශීලය හා දස සීලය, සීලයෙහි ඉදිරි පියවරක් බව පිළිගනියි.<br>• සීලයෙහි හරවත් බව හා ප්‍රායෝගික බව පැහැදිලි කරමින් පැවැත්වෙන කථාවකට සැකිල්ලක් පිළියෙල කරයි.<br>• පොහෝ දිනවල සිල් සමාදන් වෙයි.<br>• ශික්ෂාකාමී ජීවිතයක් ගත කරයි. | 02 |
| | 8.3.2 බෞද්ධ ඉගැන්වීම් ඇසුරින් අඹුසැමි, හිතමිතුරු යුතුකම් හැඳින තම යුතුකම් ඉටු කරයි. | • සිගාලෝවාද සූත්‍රයෙහි එන අඹු - සැමි හා හිත මිතුරු යුතුකම් | • සිගාලෝවාද සූත්‍රයේ සඳහන් වන අඹුසැමි හා හිත මිතුරු යුතුකම් පැහැදිලි කරයි.<br>• යුතුකම් ඉටු කිරීම මගින් අයිතිවාසිකම් සුරැකෙන බව පිළිගනියි.<br>• අඹු- සැමි හා හිත මිතුරු යුතුකම් වගුගත කරයි.<br>• යහපත් මිතුරකු ලෙස කටයුතු කරයි.<br>• යුතුකම පදනම් කරගත් ජීවිතයක් ගත කරයි. | 02 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 4.0 සුසමාහිත සමබර පෞරුෂයක් ගොඩනගා ගැනීමට කටයුතු කරයි. | **8.4.1උපාය කුසලතාවෙන් හා වගකීමෙන් යුතුව නිවැරදි තීරණ ගෙන ක්‍රියා කරයි.** | • උම්මග්ග ජාතකය<br>(වැලියොත් හා දණ්ඩක ප්‍රශ්න) | • උපාය කුසලතාව හා වගකීම යනු කුමක් දැයි පැහැදිලි කරයි.<br>• එදිනෙදා ජීවිතයේ දී උපාය කුසලතාවෙන් හා වගකීමෙන් ක්‍රියා කළ යුතු බව පිළිගනියි.<br>• උපාය කුසලතාවෙන් අභියෝග ජයගත් අවස්ථාවක් උම්මග්ග ජාතකය ඇසුරෙන් රඟ දක්වයි.<br>• දෛනික ජීවිතයේ දී සිතා විමසා කටයුතු කරයි.<br>• නිවැරදි තීරණ ගනියි. | 02 |
| 5.0 ශ්‍රී ලාංකික බෞද්ධ අනන්‍යතාව සුරකිමින් සාමයෙන් හා සහජීවනයෙන් ක්‍රියා කරයි. | **8.5.1තම බෞද්ධ අනන්‍යතාව සුරකිමින් සියලු ජනවාර්ගිකයන් හා ආගමිකයන් සමග සහජීවනයෙන් කටයුතු කරයි.** | • ආගමික සහනශීලිත්වය පිළිබඳ බුදු සිරිතෙහි නිදසුන්<br>(උපාලි සූත්‍රය)<br>සහජීවනය ඉස්මතු වන ඓතිහාසික නිදසුන් (එළාර රජුගේ සොහොනට ගරු කිරීම, ද්‍රවිඩ වාස්තු විද්‍යා ලක්ෂණ මතු කරන පොළොන්නරු පටිමාඝර, දළදා මාලිගය ආශ්‍රිත ව සතර දේවාල ඉදි වීම)<br>වත්මන් නිදසුන් | • බුදු සිරිත හා ලාංකික සමාජය ඇසුරෙන් ආගමික සහනශීලීත්වයට නිදසුන් සපයයි.<br>• විවිධ ජන වාර්ගිකයන් සහ ආගමිකයන් සමග සහජීවනයෙන් කටයුතු කළ යුතු බව පිළිගනියි.<br>• ආගමික සහනශීලීත්වය මතුවන ඓතිහාසික තොරතුරු ඇතුළත් පොත් පිංචක් නිර්මාණය කරයි.<br>• විවිධ ජනවාර්ගිකයන් සහ ආගමිකයන් සමග මිත්‍රශීලී වෙයි.<br>• තම අනන්‍යතාව රැක ගනිමින් සහජීවනයෙන් කටයුතු කරයි. | 02 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 6.0 බුදු දහමට අනුව ජීවිතය හා ලෝකය හැඳින ගෙන ප්‍රඥාවන්ත ජීවිතයක් ගත කරයි. | 8.6.1දුක පිළිබඳ බෞද්ධ විග්‍රහය තේරුම් ගෙන දුක්ඛිත අවස්ථාවන්ට නුවණින් හා වීර්යයෙන් මුහුණ දෙමින් දුක්ඛිතයන්ට පිහිටවීම. | • දුක්ඛ ආර්ය සත්‍යය<br>• දෛනික අභියෝගවලට මුහුණ දීම | • දුක්ඛ ආර්ය සත්‍යය පැහැදිලි කරයි.<br>• දුක්ඛිත තත්වයන්හි දී නුවණින් හා වීර්යයෙන් ඊට මුහුණ දිය යුතු බව පිළිගනියි.<br>• දෛනික ජීවිතයේ දී මුහුණ දීමට සිදුවන දුක්ඛිත අවස්ථාවන් ලැයිස්තු ගත කරයි.<br>• දුක්ඛිත අවස්ථාවන්හි දී නුවණින් හා වීර්යයෙන් කටයුතු කරයි.<br>• දුක්ඛිතයන්ට පිහිට වෙයි. | 02 |
| | 8.6.2 දුකට ප්‍රධාන හේතුව තෘෂ්ණාව බව පිළිගෙන අල්පේච්ඡතාවෙන් කටයුතු කරයි. | • දුක්ඛ සමුදය ආර්ය සත්‍යය<br>• බහු භාණ්ඩික බවින් හා මහිච්ඡතාවෙන් මිදීම | • දුක්ඛ සමුදය ආර්ය සත්‍යය පැහැදිලි කරයි.<br>• තෘෂ්ණාව පාලනය කරගෙන අල්පේච්ඡතාවෙන් කටයුතු කිරීමේ අගය පිළිගනියි.<br>• ''තෘෂ්ණාව සියලු දුකට හේතු වේ.'' යන මාතෘකාව යටතේ ලිපියක් සකස් කරයි.<br>• බහු භාණ්ඩික  බවින් මිදී කටයුතු කරයි.<br>• තෘෂ්ණාවට දාස නොවී කටයුතු කිරීමට හුරු වෙයි. | 02 |
| | 8.6.3 බුදු දහමෙහි ඉගැන්වෙන කර්මය හැඳින නිවැරදි ව කටයුතු කරයි. | කර්මය පිළිබඳ සරල හැඳින්වීමක් | • බුදු දහමෙහි ඉගැන්වෙන කර්ම සංකල්පය පැහැදිලි කරයි.<br>• සියල්ල කර්ම විපාක වශයෙන්ම සිදු නොවන බව පිළිගනියි.<br>• බුදු දහමෙහි ඉගැන්වෙන කර්ම සංකල්පය පිළිබඳ අන්‍යාගමික මිතුරෙකුට ලිපියක් ලියයි.<br>• නිවැරදි ක්‍රියාවන්හි යෙදෙයි.<br>• කර්මපල විශ්වාසයෙන් කටයුතු කරයි. | 02 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 7.0 ජීවි අජීවී පරිසරයට හිතකාමී ව හැසිරෙයි. | **8.7.1 සියලු ජීවීන් සමග සහකම්පනයෙන් කටයුතු කරයි.** | • කෝසල සංයුක්තයේ සඳහන් වන, ''සබ්බාදිසා අනුපරිගම්ම චේතසා'' යන ගාථාව සහ එහි නිදාන කථාව.<br>• ජීව හිතවාදී බව, අන්සතු හා පොදු සම්පත් ආරක්ෂා කිරීම. | • කෝසල සංයුක්තයේ එන මල්ලිකා සූත්‍රයෙහි සාරාංශය ඉදිරිපත් කරයි.<br>• සියලු ජීවීන් සමග සහකම්පනයෙන් කටයුතු කළ යුතු බව පිළිගනියි.<br>• සහකම්පනයෙන් කටයුතු කරන අවස්ථාවක් භූමිකා රංගනයකින් පෙන්වයි.<br>• පොදු සම්පත් ආරක්ෂා කරයි.<br>• ජීව දයාවෙන් යුතුව කටයුතු කරයි. | 02 |
| | 8.7.2 **බුදුසිරිත තුරුලතා හා බැඳී ඇති බව දැන ගහකොළ සංරක්ෂණයට දායක වෙයි.** | • තුරුලතා හා සබැඳි බුදු සිරිතේ වැදගත් සිදුවීම්<br>• සත්ත්ව ජීවිත තුරුලතා මත රැකෙන බව<br>• රුක් රෝපණයේ සහ සංරක්ෂණයේ වැදගත්කම | • බුදු සිරිත තුරුලතා හා බැඳී ඇති බවට නිදසුන් සපයයි.<br>• සියලු සතුන්ගේ පැවැත්මට තුරුලතා මහෝපකාරී වන බව පිළිගනියි.<br>• පාසල් භූමියෙහි නිශ්චිත ස්ථානයක රුක් රෝපණයට හා සංරක්ෂණයට යෝග්‍ය සැලැස්මක් සකසයි.<br>• පරිසර සංරක්ෂණයට දායක වෙයි.<br>• පරිසරයට ආදරය කරයි. | 02 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 8.0 ශාසන ඉතිහාසය හා ශ්‍රී ලාංකික බෞද්ධ උරුමය හැඳින එය රැක ගැනීමට ක්‍රියා කරයි. | **8.8.1 පළමු ධර්ම සංගායනාව අධ්‍යයනය කර,අර්බුද හා ගැටුම් නිරාකරණය කර ගනී.** | • ප්‍රථම ධර්ම සංගායනාව<br>• සසුන සුරක්ෂිත කිරීමට ගත් ක්‍රියා මාර්ග ගැටුම් නිරාකරණය පිණිස යොදා ගත හැකි අයුරු | • ප්‍රථම ධර්ම සංගායනාව පිළිබඳ ව කරුණු පැහැදිලි කරයි.<br>• ගැටලු සාකච්ඡා මාර්ගයෙන් විසඳා ගත හැකි බව පිළිගනියි.<br>• ප්‍රථම ධර්ම සංගායනාව හා බැඳුණු වැදගත් කරුණු වගු ගත කරයි.<br>• සාකච්ඡාවෙන් ගැටුම් නිරාකරණය කර ගනියි.<br>• සාමයෙන් සමගියෙන් ජීවත් වෙයි. | 02 |
| | **8.8.2 දළදා පුරා වෘත්තය හා දළදා පුද සිරිත් ඉගෙන එම පුද සිරිත් සුරැකීමට ක්‍රියා කරයි.** | • දළදා වහන්සේ, දළදා වත, දළදා පෙරහැර | • දළදා පුරා වෘත්තය හා දළදා පුද සිරිත් විස්තර කරයි.<br>• දළදා වත හා බැඳුණු පුද සිරිත් රැක ගත යුතු බව පිළිගනියි.<br>• දළදා වහන්සේ, දළදා වත, දළදා පෙරහැර යන මාතෘකා යටතේ පුවත් පතකට ලිපි ලිවීමට කරුණු ගොනු කරයි.<br>• ආගමික පුද සිරිත් ආරක්ෂා කරයි.<br>• පෞරාණික දේ රැක ගනියි. | 02 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 9.0 බෞද්ධ ආර්ථික හා රාජ්‍ය පාලන චින්තනය හැඳින ගෙන ඒ අනුව ක්‍රියා කරයි. | 8.9.1 බුදු දහමට අනුව දැහැමි ධනෝපායන මාර්ග හා ධාර්මික පරිභෝජන රටාව හැඳින ඒ අනුව කටයුතු කරයි. | • ධනෝපායනය,<br>• ධන පරිහරණය (අණන සූත්‍රය) | • අණන සූත්‍රයට අනුව ධනෝපායනය හා ධන පරිහරණය කරන අයුරු පැහැදිලි කරයි.<br>• දැහැමි ධනෝපායන මාර්ග අනුගමනය කළ යුතු බව පිළිගනියි.<br>• ධනෝපායනය හා ධන පරිහරණය නිවැරදිව සිදු කිරීමට මගපෙන්වන උපදෙස් පත්‍රිකාවක් සකසයි.<br>• දැහැමි පරිභෝජන රටාවකට හුරු වෙයි.<br>• ධාර්මික රැකියාවක නිරත වෙමින් සුවදායී ජීවිතයක් ගත කරයි. | 02 |
| | 8.9.2 සප්ත අපරිහානීය ධර්ම අධ්‍යයනය කර සාමූහික වගකීමෙන් යුතු ව ක්‍රියා කරයි. | සප්ත අපරිහානීය ධර්ම | • සප්ත අපරිහානීය ධර්ම පැහැදිලි කරයි.<br>• සප්ත අපරිහානීය ධර්ම අනුගමනයෙන් සාමූහිකව කටයුතු කළ හැකි බව පිළිගනියි.<br>• සප්ත අපරිහානීය ධර්ම ඇසුරින් යහපත් පාලනයක ලක්ෂණ ලැයිස්තු ගත කරයි.<br>• සාමූහික වගකීමෙන් යුතුව කටයුතු කරයි.<br>• පාලන නීතිරීතිවලට ගරු කරයි. | 02 |
| 10.0 නිර්වාණය අරමුණු කොටගෙන ආර්ය මාර්ගයේ ගමන් කරයි. | 8.10.1 ලෞකික, ලෝකෝත්තර දියුණුව සඳහා නිවැරදි දැක්මක් ඇතිව කායික, වාචසික, මානසික ක්‍රියාවන්හි නිරත වෙයි. | මහා මංගල සූත්‍රයේ අන්තර්ගතය බාල තරුණ හා වැඩිහිටි යන ජීවිත අවදි අනුව වැදගත් වන ආකාරය | • මහා මංගල සූත්‍රයේ ඇතුළත් මංගල කරුණු පැහැදිලි කරයි.<br>• නිවැරදි දැක්මකින් යුතුව කායික, වාචසික හා මානසික ක්‍රියාවන්හි නිරත විය යුතු බව පිළිගනියි.<br>• මහා මංගල සූත්‍රයේ ඇතුළත් මංගල කරුණු ජීවිත අවධි අනුව වැදගත් වන ආකාරය වගු ගත කරයි.<br>• යහපත් කායික වාචසික හා මානසික චර්යාවන්හි යෙදෙයි.<br>• ආධ්‍යාත්මික සුබය අත්විඳියි. | 02 |

# ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා උපදෙස්

**නිපුණතාව 01 :** තෙරුවන ගුණ හැඳින චරිතායනය කරයි.

**නිපුණතා මට්ටම 8.1.1 :** **බුද්ධ චරිතයෙහි සුවිශේෂී අවස්ථා අධ්‍යයනය කර ජීවිතය හැඩගසා ගැනීමට ක්‍රියා කරයි.**

**කාලච්ඡේද සංඛ්‍යාව :** 02යි.

**ඉගෙනුම් පල :**

- බුදුරජාණන් වහන්සේ විසින් ගැටලු සහගත අවස්ථා විසඳූ ආකාරය පිළිබඳ නිදසුන් සපයයි.
- ඕනෑම ගැටලුවකට විසඳුම් ඇති බව පිළිගනියි.
- ගැටලුවක් විසඳන ආකාරය නාට්‍යානුසාරයෙන් රඟ දක්වයි.
- ගැටලු විසඳා ගනියි.
- නිවැරදි තීරණ ගනියි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස් :**

බුදුරජාණන් වහන්සේ විවිධ අවස්ථාවල දී ගැටලු විසඳූ ආකාරය අධ්‍යයනය කොට තම ගැටලු විසඳා ගැනීමට සිසුන්ට මගපෙන්වීම මෙම පාඩමෙන් අපේක්ෂිත ය.

**පියවර 1 :**

- සිය දරුවා මිය ගොස් වියෝ දුකින් පෙළුණ කිසාගෝතමියට මනස සුවපත් කර ගෙන දුකින් මිදීමට මග පෙන්වූ කතා පුවත කියා දී පහත කරුණු මතු කරමින් සාකච්ඡාවක් මෙහෙයවන්න.
- සිය දරුවා මිය ගිය කිසාගෝතමිය දැඩි ශෝකයෙන් පෙළුණ බව
- තම පුතු මිය ගිය බව පිළිගැනීමට ඇය අකමැති වූ බව
- බුදුරජාණන් වහන්සේ මහා කරුණාවෙන් මෙම ගැටලුව විසඳා ගැනීමට මගපෙන්වූ බව

**පියවර 2 :**

- සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කොට ගවේෂණ පත්‍රිකා බෙදා දී, අදාළ ක්‍රියාකාරකමෙහි නිරත කරවන්න.

**පියවර 3 :**

- කණ්ඩායම් අනාවරණ පන්තියට ඉදිරිපත් කිරීමට හා ඌන පූරණ හෝ සංවර්ධනාත්මක යෝජනා සඳහා සිසුන්ට අවස්ථාව ලබා දෙමින් පහත සඳහන් කරුණු ද මතු කරමින් සමාලෝචනයක යෙදෙන්න.
  - බුදුරජාණන් වහන්සේ ගැටලු සහගත අවස්ථාවලට විසඳුම් ලබා දුන් බව
  - මේ සඳහා උදාහරණ රැසක් බුදු සිරිතෙන් ඉදිරිපත් කළ හැකි බව
  - දෙව්දත් හිමියන්ගේ වර පස, කාන්තාවන්ට පැවිද්ද ලබාදීම, චුල්ල පන්ථක හිමියන්ට දහම් දෙසීම හා නන්ද හිමිගේ කතා පුවත මේ සඳහා නිදසුන් කීපයක් බව
  - ගැටලුවල ස්වභාවය අනුව විසඳුම් ද විවිධ විය හැකි බව
  - ගැටලුවක දී වඩාත් ම සුදුසු විසඳුම හඳුනාගත යුතු බව
  - වර්තමාන සමාජයේ ද පෞද්ගලික හා සමාජ ගැටලුකාරී අවස්ථා මතු වන බව

- බුද්ධිමත්ව ගැටලු විසඳා ගැනීමේ හැකියාව උසස් ජීවන නිපුණතාවක් බව
- බුදුජාණන් වහන්සේ ගැටලු විසඳූ ආකාරය, වත්මන් ගැටලු විසඳා ගැනීමට ද ආදර්ශ කොට ගත හැකි බව

**ගුණාත්මක යෙදවුම්** : මෙම ගුරු මාර්ගෝපදේශයේ උපදෙස් පිළිපදිමින් ගුරුභවතාගේ අභිමතය පරිදි යොදා ගත හැකි ය.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

නිපුණතා මට්ටමට අදාළ ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණ මැන බැලීමට සුදුසු ආකාරයේ නිර්ණායක සකස් කර ගැනීමට ගුරු භවතාට නිදහස ඇත.

**ගවේෂණ පත්‍රිකාව** :

පහත සඳහන් ගැටලුකාරී අවස්ථාවල දි බුදුරජාණන් වහන්සේ ඒවා විසඳා ගැනීමට ක්‍රියා කළ ආකාරය පන්තියට ඉදිරිපත් කරන්න.

කණ්ඩායම 1 : දෙව්දත් හිමි වරපසක් ඉල්ලීම සහ කාන්තාවන්ට පැවිද්ද ලබාදීමට අදාළව පුවත් පත් වාර්තාවකට කරුණු ගොනු කරන්න.

කණ්ඩායම 2 : චුල්ල පන්ථක හිමි සහ නන්ද හිමි මුහුණ දුන් ගැටලුවල දී බුදුජාණන් වහන්සේ විසඳුම් ලබා දුන් ආකාරය පැහැදිලි කරන්න.

කණ්ඩායම 3 : ශිෂ්‍ය ජීවිතයේ මතු විය හැකි ගැටලුවක් විසඳා ගන්නා ආකාරය රඟ දක්වන්න

**ගෙදර පරිසරයෙන්** :

දරුවන් සමග සාකච්ඡා කොට නිවසේ ගැටලු හඳුනා ගන්න. ඒවා විසඳීමට හැකි මාර්ග සොයා බලන්න. වඩාත්ම නිවැරදි විසඳුම් ක්‍රියාත්මක කරන්න.

**නිපුණතාව 01 :** තෙරුවන ගුණ හැඳින චරිතායනය කරයි.

**නිපුණතා මට්ටම 8.1.2 : බුදු සිරිතේ ආචාරශීලී ගුණාංග ඇසුරෙන් තම සමාජ ජීවිතය හැඩ ගසා ගනියි.**

**කාලච්ඡේද සංඛ්‍යාව :** 02යි.

**ඉගෙනුම් පල :**

- බුදු සිරිතෙන් ප්‍රකට වන සමාජ ආචාර ධර්ම පැහැදිලි කරයි.
- සමාජයේ යහපැවැත්මට ආචාර ධර්ම හේතු වන බව පිළිගනියි.
- සමාජ ආචාර ධර්ම ලැයිස්තු ගත කරයි.
- සමීපතමයන්ට මිත්‍රශීලී වෙයි.
- ආචාරශීලී ව කටයුතු කරයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස් :**

බුදු සිරිතේ ආචාරශීලී ගුණාංග ඇසුරෙන් යහපත් සමාජ ජීවිතයක් ගත කිරීමට සිසුන්ට මගපෙන්වීම මෙම පාඩමෙන් අපේක්ෂිත ය.

**පියවර 1 :**

- ආගන්තුක සත්කාරය ඉස්මතු වන ආකාරයේ කුඩා භූමිකා රංගනයක් සිසුන් කීපදෙනෙකු ලවා රඟ දක්වන්න. පහත සඳහන් කරුණු මතු කරමින් සාකච්ඡාවක් මෙහෙයවන්න.
  - එම රංගනයෙන් පිළිබිඹු වන්නේ සමාජ ජීවිතයේ වැදගත් අවස්ථාවක් බව
  - එම අවස්ථාවෙන් ආගන්තුක සත්කාරය පිළිබිඹු වන බව
  - ආගන්තුක සත්කාරය සමාජ ආචාර ධර්මයක් බව

**පියවර 2 :**

- සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කොට ගවේෂණ පත්‍රිකා බෙදා දී, අදාළ ක්‍රියාකාරකමෙහි නිරත කරවන්න.

**පියවර 3 :**

- කණ්ඩායම් අනාවරණ පන්තියට ඉදිරිපත් කිරීමට හා ඌන පූරණ හෝ සංවර්ධනාත්මක යෝජනා සඳහා සිසුන්ට අවස්ථාව ලබා දෙමින් පහත සඳහන් කරුණු ද මතු කරමින් සමාලෝචනයක යෙදෙන්න.
  - ආගන්තුක සත්කාරය, අනතිමානී බව, සුහදශීලී කතාබහ, මහජන මතයට ගරු කිරීම යන කරුණු ආචාරශීලී ගුණාංග බව
  - බුදු සිරිත ඇසුරින් සමාජ ආචාර ධර්මවලට නිදසුන් කතා රාශියක් ඉදිරිපත් කළ හැකි බව
  - ආචාරශීලී ජීවිතයක් ගත කිරීම සඳහා මෙම ගුණාංග උපකාරී වන බව
  - ආචාරශීලී වීමෙන් පුද්ගල ජීවිතය හා සමාජ ජීවිතය සාර්ථක වන බව

**ගුණාත්මක යෙදවුම්** : මෙම ගුරු මාර්ගෝපදේශයේ උපදෙස් පිළිපදිමින් ගුරුභවතාගේ අභිමතය පරිදි යොදා ගත හැකි ය.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

නිපුණතා මට්ටමට අදාළ ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණ මැන බැලීමට සුදුසු ආකාරයේ නිර්ණායක සකස් කරගැනීමට ගුරු භවතාට නිදහස ඇත.

**ගවේෂණ පත්‍රිකාව** :

(1) ආගන්තුක සත්කාරය, අල්ප ශබ්දතාව හා නිහතමානී බව බුදු සිරිතෙන් ප්‍රකට වන ආකාරය පෙන්වා දෙන්න.

(2) සුහදශීලී කතා බහ සහ මහජන මතයට ගරු කිරීම බුදු සිරිතෙන් ප්‍රකට වන ආකාරය පෙන්වා දෙන්න.

(3) බුදු සිරිතෙන් ප්‍රකට කෙරෙන ආචාර ධර්ම සමාජ යහපැවැත්මට හේතු වන ආකාරය පැහැදිලි කරන්න.

**ගෙදර පරිසරයෙන්** :

නිවසක පැවතිය යුතු ආචාර ධර්ම පද්ධතියක් දෙමාපියන් විසින් සකස් කොට දරුවන් සමග ඒවා ක්‍රියාවට නගන්න.

**නිපුණතාව 01 :** තෙරුවන ගුණ හැඳින චරිතායනය කරයි.

**නිපුණතා මට්ටම 8.1.3 : ස්වාක්ඛාතෝ පාඨයෙහි ඇතුළත් දහම් ගුණ හැඳින විචාරශීලී ව කටයුතු කරයි.**

**කාලච්ඡේද සංඛ්‍යාව :** 02යි.

**ඉගෙනුම් පල :**

- ධර්ම රත්නයේ ගුණ අනුපිළිවෙළින් පැහැදිලි කරයි.
- දහම් ගුණ ජීවමාන බව පිළිගනියි.
- ''ස්වාක්ඛාතෝ'' පාඨය නිවැරදි ව මතකයෙන් සජ්ඣායනය කරයි.
- විචාරශීලී ව කටයුතු කරයි.
- ධර්මානුකූලව ජීවත් වෙයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස් :**

ධර්ම රත්නයේ ගුණ තේරුම් ගෙන, විචාරශීලීව කටයුතු කිරීමට මගපෙන්වීම මෙම පාඩමෙන් අපේක්ෂිත ය.

**පියවර 1**

''ඇම පමණින් පැවසූ මුනි දැන තතු
මෙම හැම දෙන බලවයි දැක්විය යුතු
තම තම නැණ පමණින් දැන ගත යුතු
මම නමදිම් සදහම් පහදා සිතු''

ලෝවැඩ සඟරාවේ සඳහන් මෙම කවිය සිසුන් සමග තාලයට ගායනා කරන්න. එහි තේරුම සාකච්ඡා කරන්න. පහත සඳහන් කරුණු ද මතු කරමින් සාකච්ඡාවක් මෙහෙයවන්න.

- මෙම කවියෙන් ධර්ම රත්නයේ ගුණ පැහැදිලි වන බව
- ධර්ම රත්නයේ ගුණ බුදුරජාණන් වහන්සේ ලොවට පහදා දී ඇති බව
- තම නුවණින් ධර්මයේ ගුණ අවබෝධ කරගත යුතු බව
- ධර්ම රත්නය වන්දනා කිරීම යනු දහම කෙරෙහි සිත පහදවා ගැනීම බව

**පියවර 2**

- සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කොට ගවේෂණ පත්‍රිකා බෙදා දී, අදාළ ක්‍රියාකාරකමෙහි නිරත කරවන්න.

**පියවර 3**

- කණ්ඩායම් අනාවරණ පන්තියට ඉදිරිපත් කිරීමට හා ඌන පූරණ හෝ සංවර්ධනාත්මක යෝජනා සඳහා සිසුන්ට අවස්ථාව ලබා දෙමින් පහත සඳහන් කරුණු ද මතු කරමින් සමාලෝචනයක යෙදෙන්න.

- ධර්ම රත්නයේ ගුණ බුදුවරයෙකු විසින්ම ලොවට අනාවරණය කරනු ලබන බව.
- ස්වාක්ඛාතෝ පාඨයෙහි ධර්මයෙහි ගුණ හයක් ඇතුළත් බව
- එදිනෙදා ජීවිතයේ දී ධර්ම රත්නයේ  ආශිර්වාදය ලබා ගත හැකි බව
- ධර්ම රත්නයෙහි ගුණ ජීවමාන වන බව
- විචාරශීලීව ධර්ම රත්නයේ ගුණ  තේරුම් ගැනීම නිවන් මගට උපකාරී වන බව

**ගුණාත්මක යෙදවුම්** : මෙම ගුරු මාර්ගෝපදේශයේ උපදෙස් පිළිපදිමින්  ගුරුභවතාගේ අභිමතය පරිදි යොදා ගත හැකි ය.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්** :

නිපුණතා මට්ටමට අදාළ  ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණ මැන බැලීමට සුදුසු  ආකාරයේ නිර්ණායක  සකස් කර ගැනීමට ගුරු භවතාට නිදහස ඇත.

**ගවේෂණ පත්‍රිකාව** :

කණ්ඩායම 1. ස්වාක්ඛාතෝ, සන්දිට්ඨිකෝ, අකාලිකෝ යන ධර්ම රත්නයේ ගුණ පැහැදිලි කරන්න.

කණ්ඩායම 2. '' ඒහිපස්සිකෝ, ඕපනයිකෝ, පච්චත්තං වේදිතබ්බෝ විඤ්ඤූහි'' යන ධර්ම රත්නයේ ගුණ පැහැදිලි කරන්න.

කණ්ඩායම 3. ධර්ම රත්නයේ ගුණ හැදින එදිනෙදා ජීවිතයේ විචාරශීලීව කටයුතු කිරීමේ වැදගත්කම පෙන්වා දෙන්න.

**ගෙදර පරිසරයෙන්** :

ධර්ම රත්නයේ ගුණ තේරුම් ගෙන දරුවන් සමග ධර්මානුකූල ජීවිතයක යෙදෙන්න.

**නිපුණතාව 02 :** ජීවන රටාව හැඩගසා ගැනීමට බෞද්ධ ඉගැන්වීම් හා ශ්‍රාවක ශ්‍රාවිකා චරිත උපයෝග කර ගනියි.

**නිපුණතා මට්ටම 8.2.1 :** **බෞද්ධ සිරිත් විරිත් හි පෞද්ගලික හා සමාජීය වටිනාකම දැන ඒවා ආදර්ශනය කරයි.**

**කාලච්ඡේද සංඛ්‍යාව :** 02යි.

**ඉගෙනුම් පල :**

- ජීවිතයේ වැදගත් අවස්ථාවන්ට උචිත බෞද්ධ සිරිත් විරිත් නම් කරයි.
- බෞද්ධ සිරිත් විරිත් අනුගමනයෙන් ආචාර සම්පන්න සමාජයක් බිහි වන බව පිළිගනියි.
- බෞද්ධ සිරිත් විරිත් කිහිපයක් නාට්‍යානුසාරයෙන් නිරූපණය කරයි.
- ජීවිතයේ වැදගත් අවස්ථාවන්හි බෞද්ධ සිරිත් විරිත් කෙරෙහි සැලකිලිමත් වෙයි.
- බෞද්ධ සිරිත් විරිත් අනුගමනය කරයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස් :**

බෞද්ධ සිරිත් විරිත්වල පෞද්ගලික හා සමාජීය වටිනාකම සිසුන්ට පැහැදිලි කොට ඒවා අනුගමනයට ඔවුන් යොමු කරවීම මෙම පාඩමෙන් අපේක්ෂිත ය.

**පියවර 1 :**

- උපන්දින හෝ විවාහ මංගල උත්සවයක දී කරන කටයුතු පිළිබඳ ව සිසුන්ගෙන් විමසන්න. ඒ ඇසුරින් පහත සඳහන් කරුණු මතු කරමින් සාකච්ඡාවක් මෙහෙයවන්න.
  - එවැනි උත්සවයක දී විවිධ ක්‍රියාකාරකම්වල නිරත වන බව
  - එවැනි අවස්ථාවක කළ යුතු දේ කිරීමත්, නොකළ යුතු දේ නොකිරීමත් වැදගත් වන බව
  - කළ යුතු දේ කිරීම සිරිත් යනුවෙනුත්, නොකළ යුතු දෙය නොකිරීම විරිත් යනුවෙනුත් හැඳින්වෙන බව

**පියවර 2 :**

- සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කොට ගවේෂණ පත්‍රිකා බෙදා දී, අදාළ ක්‍රියාකාරකමෙහි නිරත කරවන්න.

**පියවර 3 :**

- කණ්ඩායම් අනාවරණ පන්තියට ඉදිරිපත් කිරීමට හා ඌන පූරණ හෝ සංවර්ධනාත්මක යෝජනා සඳහා සිසුන්ට අවස්ථාව ලබා දෙමින් පහත සඳහන් කරුණු ද මතු කරමින් සමාලෝචනයක යෙදෙන්න.
  - මිනිසාගේ උපතේ සිට මරණය තෙක් ජීවිතයේ වැදගත් අවස්ථා රැසක් ඇති බව
  - එම අවස්ථා බොහොමයක් සියලු දෙනාටම පොදු බව
  - එබඳු අවස්ථාවල දී අනුගමනය කළ යුතු සුවිශේෂ බෞද්ධ සිරිත් විරිත් රැසක් ඇති බව

- බෞද්ධ සිරිත් විරිත් අනුගමනය කිරීමෙන් පෞද්ගලික හා සමාජීය වශයෙන් සැලසෙන ප්‍රයෝජන රැසක් ඇති බව
- සදාචාර සම්පන්න වීම හා අර්ථසම්පන්න වීම මෙහි වැදගත්ම අංග දෙක බව

**ගුණාත්මක යෙදවුම්** : මෙම ගුරු මාර්ගෝපදේශයේ උපදෙස් පිළිපදිමින් ගුරුභවතාගේ අභිමතය පරිදි යොදා ගත හැකි ය.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

නිපුණතා මට්ටමට අදාළ ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණ මැන බැලීමට සුදුසු ආකාරයේ නිර්ණායක සකස් කර ගැනීමට ගුරු භවතාට නිදහස ඇත.

**ගවේෂණ පත්‍රිකාව** :

කණ්ඩායම 1. - බෞද්ධ සිරිත් විරිත් කීපයක් මුල් කොට ගත් කෙටි නාට්‍යයක් ඉදිරිපත් කරන්න.

කණ්ඩායම 2. - අකුරු කියවීම, උපන් දින උත්සවය, ගෘහ ප්‍රවේශ මංගල්‍යය, විවාහ මංගල්‍යය යන උත්සවවලදී බෞද්ධ සිරිත් විරිත් අනුගමනය කරන ආකාරය හා එහි වටිනාකම පැහැදිලි කරන්න.

කණ්ඩායම 3. - දානමය පිංකම, පිරිත් පිංකම, අවමංගල උත්සවය යන අවස්ථාවල බෞද්ධ සිරිත් විරිත් අනුගමනය කරන ආකාරය හා එහි වටිනාකම් පැහැදිලි කරන්න.

**ගෙදර පරිසරයෙන්** :

ජීවිතයේ වැදගත් අවස්ථාවල දී දරුවන් සමගම නිවැරදි බෞද්ධ සිරිත් විරිත් අනුගමනය කරන්න. ක්‍රියාකාරීව නිරතවන්න.

**නිපුණතාව 02** : ජීවන රටාව හැඩගසා ගැනීමට බෞද්ධ ඉගැන්වීම් හා ශ්‍රාවක ශ්‍රාවිකා චරිත උපයෝග කර ගනියි.

**නිපුණතා මට්ටම 8.2.2** : **බුද්ධානුස්සති භාවනාව ඇසුරෙන් බුදු ගුණ දැක ශ්‍රද්ධාවෙන් ක්‍රියා කරයි.**

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02යි.

**ඉගෙනුම් පල** :

- බුදුගුණ භාවනාවේ යෙදෙන අයුරු තම වචනයෙන් පවසයි.
- බුදුගුණ භාවනාවෙහි ආනිශංස රැසක් ඇති බව පිළිගනියි.
- නිවැරදිව බුදුගුණ භාවනාවේ යෙදෙයි.
- දෛනිකව භාවනා කරයි.
- ශ්‍රද්ධාවෙන් ක්‍රියා කරයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්** :

බුද්ධානුස්සති භාවනාව ඇසුරින් බුදු ගුණ හැඳින ශ්‍රද්ධාවෙන් ක්‍රියා කිරීමට දරුවන් පෙලඹවීම මෙම පාඩමෙන් අපේක්ෂිත ය.

**පියවර 1** :

- '' මගේ සිත තැන්පත් ය තැන්පත් ය'' යන ගීතය දරුවන් සමඟ ගායනා කරන්න. පහත සඳහන් කරුණු මතු කරමින් සාකච්ඡාවක යෙදෙන්න.
- සිතේ තැන්පත්කම පිළිබඳ මෙම ගීතයෙන් කියවෙන බව
- සිතෙහි තැන්පත්කම සෑම කටයුත්තක ම සාර්ථකත්වයට මූලික වන බව
- සිතෙහි තැන්පත් බව ඇති කර ගැනීමට භාවනාව උපකාරී වන බව
- සිත තැන්පත් කර ගැනීම සඳහා බුදුගුණ සිහි කිරීම බුද්ධානුස්සති භාවනාව බව

**පියවර 2** :

- සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කොට ගවේෂණ පත්‍රිකා බෙදා දී, අදාළ ක්‍රියාකාරකමෙහි නිරත කරවන්න.

**පියවර 3** :

- කණ්ඩායම් අනාවරණ පන්තියට ඉදිරිපත් කිරීමට හා ඌන පූරණ හෝ සංවර්ධනාත්මක යෝජනා සඳහා සිසුන්ට අවස්ථාව ලබා දෙමින් පහත සඳහන් කරුණු ද මතු කරමින් සමාලෝචනයක යෙදෙන්න.
    - අනුස්සති භාවනා අතර බුද්ධානුස්සති භාවනාව පළමුවැන්න බව
    - නව අරහාදී බුදුගුණ පියවරෙන් පියවර මෙනෙහි කිරීම බුද්ධානුස්සති භාවනාව බව
    - බුදු ගුණ භාවනාවේ ආනිශංස රැසක් ඇති බව
    - සාර්ථක ශිෂ්‍ය ජීවිතයක් සඳහා බුදු ගුණ භාවනාව ඉවහල් වන බව
    - දෛනික ජීවිතයේ දී බුදු ගුණ භාවනාව පුගුණ කළ යුතු බව

**ගුණාත්මක යෙදවුම්** : මෙම ගුරු මාර්ගෝපදේශයේ උපදෙස් පිළිපදිමින් ගුරුභවතාගේ අභිමතය පරිදි යොදා ගත හැකි ය.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

නිපුණතා මට්ටමට අදාළ ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණ මැන බැලීමට සුදුසු ආකාරයේ නිර්ණායක සකස් කර ගැනීමට ගුරු භවතාට නිදහස ඇත.

**ගවේෂණ පත්‍රිකාව** :

කණ්ඩායම 1. බුදුගුණ භාවනාවේ යෙදෙන ආකාරය පියවරෙන් පියවර ලියා දක්වන්න.

කණ්ඩායම 2. බුදුගුණ භාවනාවේ ආනිශංස පෙළගස්වන්න.

කණ්ඩායම 3. බුදුගුණ භාවනාවේ යෙදී එහිදී මතු වූ ගැටලු ඉදිරිපත් කරන්න.

**ගෙදර පරිසරයෙන්** :

පවුලේ සියලු දෙනාම එක්ව තෙරුවන් වන්දනාවේ යෙදී අනතුරුව බුදුගුණ භාවනාවේ නිරත වන්න.

**නිපුණතාව 02** : ජීවන රටාව හැඩ ගසා ගැනීමට බෞද්ධ ඉගැන්වීම් හා ශ්‍රාවක ශ්‍රාවිකා චරිත උපයෝග කර ගනියි.

**නිපුණතා මට්ටම 8.2.3** : ශ්‍රාවක චරිත ආදර්ශයට ගෙන තම ජීවිතය හැඩ ගසා ගනියි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02යි.

**ඉගෙනුම් පල** :

- සැරියුත්, මුගලන් මහරහතන් වහන්සේලාගේ චරිතාපදාන ගෙනහැර දක්වයි.
- සැරියුත්, මුගලන් දෙනම වහන්සේලාගේ චරිතවලින් ජීවිතාදර්ශ ලැබිය හැකි බව පිළිගනියි.
- සැරියත් මුගලන් මහරහතන් වහන්සේලාගේ චරිතයන්හි වැදගත් සිදුවීම් හා ආදර්ශ වගුගත කරයි.
- ආදර්ශවත් පුද්ගලයන්ට ගරු බුහුමන් දක්වයි.
- සත්පුරුෂ ලක්ෂණ ප්‍රදර්ශනය කරයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්** :

සැරියුත් මුගලන් මහරහතන් වහන්සේලාගේ චරිත ආදර්ශයට ගෙන තම ජීවිතය හැඩගසා ගැනීමට මගපෙන්වීම මෙම පාඩමෙන් අපේක්ෂිත ය.

**පියවර 1** :

''සිරිමත් බඹ සිරසෙහි පා පිසිනා
සැරියුත් මහ මුගලන් පිළි වෙළිනා
පිළිවෙත් සරු මහ සඟ ගණ සොබනා
මුදුනත් බැඳ නමදිම් බැති පෙමිනා''

ලෝවැඩ සඟරාවේ සඳහන් මෙම කවිය සිසුන් සමග තාලයට ගායනා කරන්න. පහත සඳහන් කරුණු මතු කරමින් සාකච්ඡාවක යෙදෙන්න.

- මෙම කවිය ලෝවැඩ සඟරාවේ ඇතුළත් වන බව
- මෙම කවියෙන් සංඝ රත්නය පිළිබඳව කියවෙන බව
- සැරියුත් මුගලන් මහ රහතන් වහන්සේලාට සංඝ සමාජය තුළ සුවිශේෂී තැනක් හිමි වන බව

**පියවර 2** :

- සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කොට ගවේෂණ පත්‍රිකා බෙදා දී, අදාළ ක්‍රියාකාරකමෙහි නිරත කරවන්න.

**පියවර 3** :

- කණ්ඩායම් අනාවරණ පන්තියට ඉදිරිපත් කිරීමට හා ඌන පූරණ හෝ සංවර්ධනාත්මක යෝජනා සඳහා සිසුන්ට අවස්ථාව ලබා දෙමින් පහත සඳහන් කරුණු ද මතු කරමින් සමාලෝචනයක යෙදෙන්න.
  - සැරියුත් මුගලන් මහරහතන් වහන්සේලා බුදුරජාණන් වහන්සේගේ අග්‍රශ්‍රාවක තනතුරු හෙබ වූ බව
  - ගිහි අවධියේ සිටම උන්වහන්සේලා කළණ මිතුරන් වූ බව

- උපතිස්ස කෝලිත නම් වූ මෙම මිතුරන් දෙදෙනා ගිරග්ග සමජ්ජ නම් වූ සැණකෙළිය නරඹා ජීවිතයේ හරය සෙවීමට තීරණය කළ බව
- ඔවුන් පරිබ්‍රාජකයන් ලෙස සත්‍ය ගවේෂණයේ යෙදුණ බව
- අස්සජි මහ රහතන් වහන්සේ දේශනා කළ ගාථාවෙහි මුල් දෙපදය අසා උපතිස්ස පිරිවැජියා සෝවාන් වූ බව
- කෝලිත පිරිවැජියා ද පසුව උපතිස්ස පිරිවැජියාගෙන් එම ගාථා ධර්මය අසා සෝවාන් වූ බව
- උපතිස්ස කෝලිත දෙදෙනා සැරියුත් මුගලන් නමින් බුද්ධ ශාසනයට ඇතුළත් වූ බව
- මෙම දෙදෙනා වහන්සේට බුදු සසුනේ අග්‍රශ්‍රාවක තනතුරු හිමි වූ බව
- ගුරු ගෞරවය, නිහතමානී බව, අන් අය පහදවා ගැනීම, විචාරශීලී බව, ඉවසීම, නොමගට ගිය අය සුමගට ගැනීම ආදිය ද මෙම චරිතවලින් මූර්තිමත් වන බව
- දකුණත් සව් තනතුර, ප්‍රඥාවන්ත භික්ෂූන් අතර අග්‍රස්ථානය හා ධර්ම සේනාධිපති තනතුර සැරියුත් මා හිමියන් දැරූ බව
- මුගලන් මා හිමියන් වමත් සව් තනතුර, ඍද්ධිමතුන් අතර අග තනතුර ආදිය ලැබූ බව
- සැරියුත්, මුගලන් මහ රහතන් වහන්සේලා බුදුරජාණන් වහන්සේගේ ඇගයුමට ලක් වූ බව

**ගුණාත්මක යෙදවුම්** : මෙම ගුරු මාර්ගෝපදේශයේ උපදෙස් පිළිපදිමින් ගුරුභවතාගේ අභිමතය පරිදි යොදා ගත හැකි ය.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

නිපුණතා මට්ටමට අදාළ ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණ මැන බැලීමට සුදුසු ආකාරයේ නිර්ණායක සකස් කර ගැනීමට ගුරු භවතාට නිදහස ඇත.

**ගවේෂණ පත්‍රිකාව** :

කණ්ඩායම 1. : සැරියුත් මහ රහතන් වහන්සේගේ චරිතයේ වැදගත් සිදුවීම් නම් කොට එම චරිතයෙන් ලබා ගත හැකි ජීවිතාදර්ශ ඉදිරිපත් කරන්න.

කණ්ඩායම 2. : මුගලන් මහ රහතන් වහන්සේගේ චරිතයේ වැදගත් සිදුවීම් නම් කොට එම චරිතයෙන් ලබා ගත හැකි ජීවිතාදර්ශ ඉදිරිපත් කරන්න.

**ගෙදර පරිසරයෙන්** :

අසූ මහා ශ්‍රාවකයන් වහන්සේලාගේ චරිත කතා කිහිපයක් දරුවන් සමග අධ්‍යයනය කොට ඉන් ලබා ගත හැකි ආදර්ශ සාකච්ඡා කරන්න.

**නිපුණතාව 02 :** ජීවන රටාව හැඩගසා ගැනීමට බෞද්ධ ඉගැන්වීම් හා ශ්‍රාවක ශ්‍රාවිකා චරිත උපයෝග කර ගනියි.

**නිපුණතා මට්ටම 8.2.4 : ධම්මපද ගාථා ඇසුරින් තම ජීවන දර්ශනය හැඩගසා ගැනීමට ක්‍රියා කරයි.**

**කාලච්ඡේද සංඛ්‍යාව : 02යි.**

**ඉගෙනුම් පල :**

- ධම්මපද ගාථා දෙකෙහි සරල අරුත පවසයි.
- වැරදි කළ අයකුට වුවද කළ වරද තේරුම් ගෙන යහපතෙහි පිහිටා නිවරදි පුද්ගලයකු විය හැකි බව පිළිගනියි.
- ධම්ම පද ගාථා දෙක නිවැරදි ව මතකයෙන් සජ්ඣායනය කරයි.
- ක්‍රියාවට පෙර ප්‍රතිඵල පිළිබඳ සැලකිලිමත් වෙයි.
- තම වැරදි නිවැරදි කර ගනියි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස් :**

ධම්මපද ගාථා ඇසුරෙන් තම ජීවිතය හැඩ ගසා ගැනීමට මග පෙන්වීම මෙම පාඩමෙන් අපේක්ෂිත ය.

**පියවර 1 :**

- ''ධම්මපදය'' සිසුන්ට පෙන්වන්න. පහත සඳහන් කරුණු මතු කරමින් සාකච්ඡාවක් මෙහෙයවන්න.
- ධම්මපදයෙහි වටිනා ධර්ම උපදේශ රැසක් ඇති බව
- එය බෞද්ධයාගේ අත්පොත ලෙස සැලකෙන බව
- එම කෘතිය ධම්මපදය ලෙස හැඳින්වෙන බව

**පියවර 2 :**

- සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කොට ගවේෂණ පත්‍රිකා බෙදා දී, අදාළ ක්‍රියාකාරකමෙහි නිරත කරවන්න.

**පියවර 3 :**

- කණ්ඩායම් අනාවරණ පන්තියට ඉදිරිපත් කිරීමට හා ඌන පූරණ හෝ සංවර්ධනාත්මක යෝජනා සඳහා සිසුන්ට අවස්ථාව ලබා දෙමින් පහත සඳහන් කරුණු ද මතු කරමින් සමාලෝචනයක යෙදෙන්න.
- ධම්මපදය වග්ග 26කින් හා ගාථා 423කින් සමන්විත බව
- නිර්දිෂ්ට පළමු ගාථාවේ අදහස,
  යමෙක් ප්‍රමාදී බවෙන් මිදී පසුව අප්‍රමාදීව ධර්මයේ හැසිරේ ද වලාකුළෙන් මිදුණ සඳ සේ ඔහු බබලන බව

- දෙවන ගාථාවේ අදහස,
  යමෙකු විසින් සිදු කරන ලද පාපය, රහත් වීමෙන් (කුසලයෙන්) යටපත් කරයි ද එතැන් පටන් වලාකුළින් මිදුණු සඳ මෙන් ඔහු බබලන බව
- කිසියම් ක්‍රියාවක් සිදු කිරීමට පෙර එයින් ලැබෙන ප්‍රතිඵල ගැන සැලකිලිමත් විය යුතු බව
- අකුසලයෙන් වැළකී කුසලයෙහි නිරත විය යුතු බව
- ඕනෑම පුද්ගලයෙකුට තමා සිදු කළ වරද වටහා ගෙන කුසල ධර්ම වර්ධනයෙන් යහපත් අයකු විය හැකි බව

**ගුණාත්මක යෙදවුම්** : මෙම ගුරු මාර්ගෝපදේශයේ උපදෙස් පිළිපදිමින් ගුරුභවතාගේ අභිමතය පරිදි යොදා ගත හැකි ය.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්** :

නිපුණතා මට්ටමට අදාළ ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණ මැන බැලීමට සුදුසු ආකාරයේ නිර්ණායක සකස් කරගැනීමට ගුරු භවතාට නිදහස ඇත.

**ගවේෂණ පත්‍රිකාව** :

කණ්ඩායම 1. '' යෝච පුබ්බේ පමජ්ජිත්වා .......................................''

- ගාථාව තාලයට සජ්ඣායනා කරන්න.
- එහි සරල අදහස ඉදිරිපත් කරන්න.
- නිදාන කතාව කෙටියෙන් පැහැදිලි කරන්න.
- අදාළ ගාථාවේ එන උපදේශයෙහි වටිනාකම පෙන්වා දෙන්න.

කණ්ඩායම 2. ''යස්ස පාපං කතං කම්මං ............''

- ගාථාව තාලයට සජ්ඣායනා කරන්න.
- එහි සරල අදහස ඉදිරිපත් කරන්න.
- නිදාන කථාව කෙටියෙන් පැහැදිලි කරන්න.
- අදාළ ගාථාවේ එන උපදේශයෙහි වටිනාකම පෙන්වා දෙන්න.

**ගෙදර පරිසරයෙන්** :

සවස බුද්ධ වන්දනාවේ දී සතියකට වරක්වත් ධම්ම පද ගාථාවක් සජ්ඣායනා කොට එහි අර්ථය පිළිබඳ සාකච්ඡා කරන්න.

**නිපුණතාව 02 :** ජීවන රටාව හැඩ ගසා ගැනීමට බෞද්ධ ඉගැන්වීම් හා ශ්‍රාවක ශ්‍රාවිකා චරිත උපයෝග කර ගනියි.

**නිපුණතා මට්ටම 8.2.5 :** **තම ආචාර ධර්ම ගොඩනගා ගැනීමට භික්ෂු විනයේ එන සේඛියා ධර්ම අදාළ පරිදි උපයෝග කර ගනියි.**

**කාලච්ඡේද සංඛ්‍යාව :** 02යි.

**ඉගෙනුම් පල :**

- ''සේඛියා ධර්ම'' යන්න පැහැදිලි කරයි.
- කථා බහ, ඇඳුම, ගමන බිමන ආචාරශීලී විය යුතු බව පිළිගනියි.
- සේඛියා ධර්ම ඇසුරෙන් ආචාර ධර්ම ලේඛනයක් සකස් කරයි.
- දෛනික ජීවිතයේ දී ආචාර ධර්ම පිළිපදියි.
- ප්‍රියශීලී පුද්ගලයකු වෙයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස් :**

සේඛියා ධර්ම ඇසුරෙන් තම ජීවිතය ගොඩනගා ගැනීම සඳහා අවශ්‍ය දැනුම ලබාදීම මෙම පාඩමෙන් අපේක්ෂා කෙරේ.

**පියවර 1 :**

- කාලිංග යුද්ධයෙන් දැඩි පීඩාවට පත්ව සිටි අශෝක අධිරාජ්‍යයා සඳලු තලයේ සිට පහත බලන විට සංවර ව වඩින නිග්‍රෝධ සාමණේරයන් දැක පැහැදී උන් වහන්සේගෙන් ධර්මය ශ්‍රවණය කොට බෞද්ධයකුවීමේ කතා පුවත පැහැදිලි කරන්න. පහත සඳහන් කරුණු ද මතු කරමින් සාකච්ඡාවක් මෙහෙයවන්න.
  - ආහාරපාන, ඇඳුම, ගමන් විලාශය හා කතා බහ, සංවරශීලී පැවැත්ම තව කෙනෙකුගේ සිතේ පැහැදීමට හෝ අපැහැදීමට බලපාන බව
  - සංවරශීලී ඇඳුම, ගමන් විලාසය හා කතා බහ ආචාරශීලීත්වයට බලපාන බව
  - ආචාරශීලී පැවැත්ම දියුණුවේ ලක්ෂණයක් වන බව
  - සේඛියා ධර්මවලින් ආචාර ධර්ම පිළිබඳ ව ඉගැන්වෙන බව

**පියවර 2 :**

- සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කොට ගවේෂණ පත්‍රිකා බෙදා දී, අදාළ ක්‍රියාකාරකමෙහි නිරත කරවන්න.

**පියවර 3 :**

- කණ්ඩායම් අනාවරණ පන්තියට ඉදිරිපත් කිරීමට හා ඌන පූරණ හෝ සංවර්ධනාත්මක යෝජනා සඳහා සිසුන්ට අවස්ථාව ලබා දෙමින් පහත සඳහන් කරුණු ද මතු කරමින් සමාලෝචනයක යෙදෙන්න. :
  - භික්ෂු විනයේ සේඛියා ධර්ම දේශනා කොට ඇති බව
  - සේඛියා ධර්ම ඇසුරින් ඇඳුම, ආහාර ගැනීම, ගමන් විලාසය හා නිවැරදි කතා බහ, පිළිබඳව වැඩි අවධානයක් යොමු කොට ඇති බව

- සේඛියා ධර්ම අනුව ආචාරශීලී ජීවිතයක් ගත කළ හැකි බව
- ගිහි ආචාර ධර්ම ගොඩනගා ගැනීමට සේඛියා ධර්ම උපයෝග කර ගත හැකි බව
- ගිහියාගේ දෛනික ජීවිතය එම ආචාර ධර්ම තුළින් සාර්ථක කර ගත හැකි බව

**ගුණාත්මක යෙදවුම්** : මෙම ගුරු මාර්ගෝපදේශයේ උපදෙස් පිළිපදිමින් ගුරුභවතාගේ අභිමතය පරිදි යොදා ගත හැකි ය.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

නිපුණතා මට්ටමට අදාළ ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණ මැන බැලීමට සුදුසු ආකාරයේ නිර්ණායක සකස් කර ගැනීමට ගුරු භවතාට නිදහස ඇත.

**ගවේෂණ පත්‍රිකාව** :

කණ්ඩායම 1. ආචාරශීලී ගිහි ජීවිතයක් ගත කරන්නෙකුට සේඛියා ධර්ම උපයෝග කර ගත හැකි ආකාරය පැහැදිලි කරන්න.

කණ්ඩායම 2. ගමන බිමන යාමේ හා ඇඳුම්, පැළඳුම් භාවිතය සම්බන්ධ සේඛියා ධර්ම පැහැදිලි කරන්න.

කණ්ඩායම 3. කතා බහ කිරීමට හා ආහාර ගැනීමට අදාළ සේඛියා ධර්ම පැහැදිලි කරන්න.

**ගෙදර පරිසරයෙන්** :

ඇඳුම් පැළඳුම් භාවිතය, ආහාර ගැනීම, කතා බහ සහ ගමන බිමන හේතුවෙන් අපහසුතාවන්ට පත්වන අවස්ථා පැහැදිලි කරමින් නිවැරදි දේ සඳහා දරුවන් යොමු කිරීමට ආදර්ශවත් වන්න.

**නිපුණතාව 03 :** බෞද්ධ සාරධර්ම අගය කරමින් පිළිපදියි.

**නිපුණතා මට්ටම 8.3.1 : අෂ්ටාංග උපෝසථ සීලය හා දස සීලය අගයන සහ සුරකින සමාජයක් ගොඩනැගීමට දායක වෙයි.**

**කාලච්ඡේද සංඛ්‍යාව :** 02යි.

**ඉගෙනුම් පල :**

- අෂ්ටාංග උපෝසථ සීලය හා දස සීලය නම් කරයි.
- අෂ්ටාංග උපෝසථ ශීලය හා දස සීලය, සීලයෙහි ඉදිරි පියවරක් බව පිළිගනියි.
- සීලයෙහි හරවත් බව හා ප්‍රායෝගික බව පැහැදිලි කරමින් පැවැත්වෙන කථාවකට සැකිල්ලක් පිළියෙල කරයි.
- පොහෝ දිනවල සිල් සමාදන් වෙයි.
- ශික්ෂාකාමී ජීවිතයක් ගත කරයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස් :**

අෂ්ටාංග උපෝසථ සීලයෙහි හා දස සීලයෙහි හරවත් බව පිළිබඳ ප්‍රායෝගික අවබෝධයක් ලබාදීම මෙම පාඩමෙන් අපේක්ෂිත ය.

**පියවර 1 :**

- අෂ්ටාංග උපෝසථ සීලය සමාදන් වූ පිරිසකගේ පින්තූරයක් දරුවන්ට ඉදිරිපත් කොට පහත සඳහන් කරුණු මතු කරමින් සාකච්ඡාවක යෙදෙන්න.
  - පින්තූරයෙහි දැක්වෙන්නේ සිල් සමාදන් වූ පිරිසකගේ දර්ශනයක් බව
  - විශේෂ අවස්ථාවන්හි සමාදන් වන සිල් වර්ග ඇති බව
  - අෂ්ටාංග සීලය හා දස සීලය එවැනි ප්‍රභේද දෙකක් බව
  - සතර පෝය දිනවල මෙම සීලය සමාදන් වන බව

**පියවර 2 :**

- සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කොට ගවේෂණ පත්‍රිකා බෙදා දී, අදාළ ක්‍රියාකාරකමෙහි නිරත කරවන්න.

**පියවර 3 :**

- කණ්ඩායම් අනාවරණ පන්තියට ඉදිරිපත් කිරීමට හා ඌන පූරණ හෝ සංවර්ධනාත්මක යෝජනා සඳහා සිසුන්ට අවස්ථාව ලබා දෙමින් පහත සඳහන් කරුණු ද මතු කරමින් සමාලෝචනයක යෙදෙන්න.
- අෂ්ටාංග උපෝසථ සීලය හා දස සීලය පංච සීලයට ඉදිරි පියවරක් බව
- සීලය යන්නෙන් අදහස් කරනුයේ කය වචන සංවර කිරීම බව
- අෂ්ටාංග උපෝසථ සීලයට ශික්ෂා පද අටක් අයත් වන බව
- දස සීලයට ශික්ෂා පද දහයක් අයත් වන බව

- ගිහි සීලය පංච සීලයෙන් ආරම්භ වී ගිහි දස සීලයෙන් අවසන් වන බව
- සීලය ආරක්ෂා කිරීමෙන් පුද්ගලයා ශික්ෂණයට පත් වන බව
- සිල්වත් වීමෙන් දෛනික ජීවිතය සාර්ථක වන බව
- උපෝසථ සීලය මගින් නිවනට යොමුවන බව

**ගුණාත්මක යෙදවුම්** : මෙම ගුරු මාර්ගෝපදේශයේ උපදෙස් පිළිපදිමින් ගුරුභවතාගේ අභිමතය පරිදි යොදා ගත හැකි ය.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

නිපුණතා මට්ටමට අදාළ ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණ මැන බැලීමට සුදුසු ආකාරයේ නිර්ණායක සකස් කර ගැනීමට ගුරු භවතාට නිදහස ඇත.

**ගවේෂණ පත්‍රිකාව** :

කණ්ඩායම 1. අෂ්ටාංග උපපෝසථ සීලය නම් කොට තේරුම පැහැදිලි කරන්න.

කණ්ඩායම 2. දස සීලය නම් කොට තේරුම් පැහැදිලි කරන්න.

කණ්ඩායම 3. අෂ්ටාංග සීලය හා දස සීලය සුරැකීමෙන් සමාජයට සිදු වන යහපත විස්තර කරන්න.

**ගෙදර පරිසරයෙන්** :

පොහෝ දින දරුවන් සමඟ අෂ්ටාංග උපෝසථ සීලය සමාදන් වන්න.

**නිපුණතාව 03 :** බෞද්ධ සාරධර්ම අගය කරමින් පිළිපදියි.

**නිපුණතා මට්ටම 8.3.2 : බෞද්ධ ඉගැන්වීම් ඇසුරින් අඹුසැමි, හිතමිතුරු යුතුකම් හැඳින තම යුතුකම් ඉටු කරයි.**

**කාලච්ඡේද සංඛ්‍යාව :** 02යි.

**ඉගෙනුම් පල :**

- සිගාලෝවාද සූත්‍රයේ සඳහන් වන අඹුසැමි හා හිත මිතුරු යුතුකම් පැහැදිලි කරයි.
- යුතුකම් ඉටු කිරීම මගින් අයිතිවාසිකම් සුරැකෙන බව පිළිගනියි.
- අඹු- සැමි හා හිත මිතුරු යුතුකම් වගුගත කරයි.
- යහපත් මිතුරකු ලෙස කටයුතු කරයි.
- යුතුකම පදනම් කරගත් ජීවිතයක් ගත කරයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස් :**

සිගාලෝවාද සූත්‍රයේ දැක්වෙන අඹු - සැමි හා හිත මිතුරු යුතුකම් හැඳින තම යුතුකම් ඉටු කිරීමට දරුවන් පෙලඹවීම මෙම පාඩමෙන් අපේක්ෂිත යි.

**පියවර 1 :**

'' මාතා පිතා දිසා පුබ්බා
ආචරියා දක්ඛිණා දිසා
පුත්තදාරා දිසා පච්ඡා
මිත්තාමත්තාච උත්තරා
දාස කම්මකරා හෙට්ඨා
උද්ධං සමණ බ්‍රාහ්මණා
එතෙ දිසා නමස්සෙය්‍ය'
අලමත්තෝ කුලේ ගිහි ''

මෙම ගාථාව සිසුන් සමග තාලයට සජ්ඣායනා කරන්න. පහත සඳහන් කරුණු ඉස්මතු වන සේ සාකච්ඡාව මෙහෙයවන්න.

- මෙම ගාථා සිගාලෝවාද සූත්‍රයේ ඇතුළත් බව
- දිසා හයකින් අන්‍යොන්‍ය යුතුකම් ඉගැන්වෙන බව
- එහිදී බටහිර (පශ්චිම) උතුරු (උත්තර) දිශා මගින් පිළිවෙලින් අඹු සැමි හා හිත මිතුරු සම්බන්ධතා ඉදිරිපත් කර ඇති බව

**පියවර 2** :

- සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කොට ගවේෂණ පත්‍රිකා බෙදා දී, අදාළ ක්‍රියාකාරකමෙහි නිරත කරවන්න.

**පියවර 3** :

- කණ්ඩායම් අනාවරණ පන්තියට ඉදිරිපත් කිරීමට හා ඌන පූරණ හෝ සංවර්ධනාත්මක යෝජනා සඳහා සිසුන්ට අවස්ථාව ලබා දෙමින් පහත සඳහන් කරුණු ද මතු කරමින් සමාලෝචනයක යෙදෙන්න. :
    - ගිහි විනය නමින් ද මෙම සූත්‍රය හැඳින්වෙන බව
    - බටහිර දිශාවෙන් අඹුසැමි සබඳතාව ද, උතුරු දිසාවෙන් හිත මිතුරු සබඳතාව ද ඉදිරිපත් කර ඇති බව
    - මෙහි අන්‍යෝන්‍ය යුතුකම් ප්‍රකට වන බව
    - යුතුකම් ඉටු කිරීම නිසා ශිෂ්ට සම්පන්න සමාජයක් බිහි වන බව

**ගුණාත්මක යෙදවුම්** : මෙම ගුරු මාර්ගෝපදේශයේ උපදෙස් පිළිපදිමින් ගුරුභවතාගේ අභිමතය පරිදි යොදා ගත හැකි ය.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

නිපුණතා මට්ටමට අදාළ ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණ මැන බැලීමට සුදුසු ආකාරයේ නිර්ණායක සකස් කර ගැනීමට ගුරු භවතාට නිදහස ඇත.

**ගවේෂණ පත්‍රිකාව** :

ඔබට ලැබෙන මාතෘකාවට අදාළ ව පහත සඳහන් කරුණු යටතේ තොරතුරු රැස් කරන්න.

කණ්ඩායම 1. බටහිර දිසාව නියෝජනය වන සමාජ සබඳතා නම් කොට එහි ඇතුළත් යුතුකම් හා වගකීම් පැහැදිලි කරන්න.

කණ්ඩායම 2. උතුරු දිසාව නියෝජනය වන සමාජ සබඳතා නම් කොට එහි ඇතුළත් යුතුකම් හා වගකීම් පැහැදිලි කරන්න.

කණ්ඩායම 3. අන්‍යෝන්‍ය යුතුකම් ඉටු කිරීම තුළින් යහපත් සමාජ සබඳතා ගොඩනැගෙන ආකාරය පැහැදිලි කරන්න.

**ගෙදර පරිසරයෙන්** :

සමාජයේ එකිනෙකා සතු යුතුකම් හඳුනා ගෙන දරුවාට ආදර්ශවත් ව මග පෙන්වන්න.

**නිපුණතාව 04** : සුසමාහිත සමබර පෞරුෂයක් ගොඩනඟා ගැනීමට කටයුතු කරයි.

**නිපුණතා මට්ටම 8.4.1** : **උපාය කුසලතාවෙන් හා වගකීමෙන් යුතුව නිවැරදි තීරණ ගෙන ක්‍රියා කරයි.**

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02යි.

**ඉගෙනුම් පල** :

- උපාය කුසලතාව හා වගකීම යනු කුමක් දැයි පැහැදිලි කරයි.
- එදිනෙදා ජීවිතයේ දී උපාය කුසලතාවෙන් හා වගකීමෙන් ක්‍රියා කළ යුතු බව පිළිගනියි.
- උපාය කුසලතාවෙන් අභියෝග ජයගත් අවස්ථාවක් උම්මග්ග ජාතකය ඇසුරෙන් රඟ දක්වයි.
- දෛනික ජීවිතයේ දී සිතා විමසා කටයුතු කරයි.
- නිවැරදි තීරණ ගනියි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස් :**

උපාය කුසලතාවෙන් හා වගකීමෙන් යුතු ව නිවැරදි ව තීරණ ගෙන කටයුතු කිරීමට සිසුන්ට මග පෙන්වීම මෙම පාඩමෙන් අපේක්ෂා කෙරේ.

**පියවර 1** :

- අඩියක පමණ දඬු කැබැල්ලක් ඉදිරිපත් කොට එහි අග හා මුල හඳුනා ගන්නේ කෙසේ දැයි සිසුන්ගෙන් විමසන්න. පහත කරුණු මතු කරමින් සාකච්ඡාවක් මෙහෙයවන්න.
- වේදේහ නම් රජකු විසින් මහෞෂධ කුමරුන්ගේ ප්‍රඥාව විමසා බැලීම සඳහා මෙවැනි ගැටලුවක් ඉදිරිපත් කරන ලද බව
- මෙම කතා පුවත උම්මග්ග ජාතකයේ සඳහන් බව
- ගැටලුවලට විසඳුම් සෙවීමේ දී උපායශීලීව, වගකීමෙන් ක්‍රියා කළ යුතු බව

**පියවර 2** :

- සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කොට ගවේෂණ පත්‍රිකා බෙදා දී, අදාළ ක්‍රියාකාරකමෙහි නිරත කරවන්න.

**පියවර 3** :

- කණ්ඩායම් අනාවරණ පන්තියට ඉදිරිපත් කිරීමට හා ඌන පූරණ හෝ සංවර්ධනාත්මක යෝජනා සඳහා සිසුන්ට අවස්ථාව ලබා දෙමින් පහත සඳහන් කරුණු ද මතු කරමින් සමාලෝචනයක යෙදෙන්න.
    - ගැටලු සහගත අවස්ථාවල දී නිවැරදි වූත් සාධාරණ වූත් විසඳුමක් ලබාදීමේ හැකියාව උපාය කුසලතාව බව
    - තමන් වෙත පැවරෙන කාර්යයන් නිවැරදි ව හා නිසිලෙස ඉටුකිරීම වගකීම බව
    - උම්මග්ග ජාතකයේ සඳහන් කථා වස්තුවලින් බෝසතාණන් වහන්සේගේ ප්‍රඥා මහිමය මැනවින් ප්‍රකට වන බව
    - දණ්ඩක හා වැලියොත් ප්‍රශ්න විසඳූ ආකාරයෙන් මහ බෝසතාණන්ගේ උපාය කුසලතාව හා වගකීම් දැරීමේ හැකියාව ප්‍රකට කෙරෙන බව

- දෛනිකව එළඹෙන ගැටලුවලට විසඳුම් සෙවීමේ දී උපාය කුසලතාවෙන් හා වගකීමෙන් ක්‍රියා කිරීම වැදගත් බව
- කුඩා කල සිට උපාය කුසලතාවෙන් හා වගකීමෙන් කටයුතු කිරීම ජීවිත සාර්ථකත්වයට ඉවහල් වන බව

**ගුණාත්මක යෙදවුම්** : මෙම ගුරු මාර්ගෝපදේශයේ උපදෙස් පිළිපදිමින් ගුරුභවතාගේ අභිමතය පරිදි යොදා ගත හැකි ය.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

නිපුණතා මට්ටමට අදාළ ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණ මැන බැලීමට සුදුසු ආකාරයේ නිර්ණායක සකස් කර ගැනීමට ගුරු භවතාට නිදහස ඇත.

**ගවේෂණ පත්‍රිකාව** :

කණ්ඩායම 1. වැලියොත් ප්‍රශ්නය විසඳූ ආකාරය නාට්‍යානුසාරයෙන් පන්තියට ඉදිරිපත් කරන්න.

කණ්ඩායම 2. දණ්ඩක ප්‍රශ්නය විසඳූ ආකාරය නාට්‍යානුසාරයෙන් පන්තියට ඉදිරිපත් කරන්න.

කණ්ඩායම 3. එදිනෙදා ජීවිතයේ දී උපාය කුසලතාවෙන් හා වගකීමෙන් කටයුතු කිරීමේ වැදගත්කම පෙන්වා දෙන්න.

**ගෙදර පරිසරයෙන්** :

දරුවන්ගේ ගැටලු ඔවුන් සමග සාකච්ඡා කරන්න. උපායශීලීව හා වගකීමෙන් යුතුව එම ගැටලු විසඳීමට ක්‍රියා කරන්න.

**නිපුණතාව 05 :** ශ්‍රී ලාංකික බෞද්ධ අනන්‍යතාව සුරකිමින් සාමයෙන් හා සහජීවනයෙන් ක්‍රියා කරයි.

**නිපුණතා මට්ටම 8.5.1 :** **තම බෞද්ධ අනන්‍යතාව සුරකිමින් සියලු ජනවාර්ගිකයන් හා ආගමිකයන් සමග සහජීවනයෙන් කටයුතු කරයි.**

**කාලච්ඡේද සංඛ්‍යාව :** 02යි.

**ඉගෙනුම් පල :**

- බුදු සිරිත හා ලාංකික සමාජය ඇසුරෙන් ආගමික සහනශීලීත්වයට නිදසුන් සපයයි.
- විවිධ ජන වාර්ගිකයන් සහ ආගමිකයන් සමග සහජීවනයෙන් කටයුතු කළ යුතු බව පිළිගනියි.
- ආගමික සහනශීලීත්වය මතුවන ඓතිහාසික තෙරතුරු ඇතුළත් පොත් පිංචක් නිර්මාණය කරයි.
- විවිධ ජනවාර්ගිකයන් සහ ආගමිකයන් සමග මිත්‍රශීලී වෙයි.
- තම අනන්‍යතාව රැක ගනිමින් සහජීවනයෙන් කටයුතු කරයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස් :**

තම බෞද්ධ අනන්‍යතාව සුරකිමින් සියලු ජන වාර්ගිකයන් සහ ආගමිකයන් සමග සහජීවනයෙන් කටයුතු කිරීමට සිසුන් යොමු කිරීම මෙම පාඩමෙන් අපේක්ෂිත ය.

**පියවර 1 :**

'' පන්සලේ පල්ලියේ

දහදියෙන් අප තැනූ

පිළිම දාගැබ් පෙනේ

ලෝකයක් දණ නැමූ

ඒ අපේ ශක්තියයි

ඒ අපේ ජීවයයි

වන්දනා කරන්නේ

වන්දනා ලබන්නේ ............ ''

යන ගීතය සිසුන්ට ශ්‍රවණය කිරීමට සලස්වන්න. පහත සඳහන් කරුණු මතු කරමින් සාකච්ඡාවක් මෙහෙයවන්න.

- මෙම ගීතයෙන් ධ්වනිත වන්නේ ශ්‍රී ලාංකික මුතුන් මිත්තන්ගේ ක්‍රියාකාරකම් පිළිබඳව ඇති වන අභිමානය බව
- අතීත මුතුන් මිත්තන් සහයෝගයෙන් හා සහජීවනයෙන් පොදු කටයුතු සිදු කළ ආකාරය ගීතයෙන් ප්‍රකාශ වන බව
- සහයෝගය හා සහජීවනය පදනම්ව ජාතික හා ආගමික සහනශීලිතාව ගොඩනැගෙන බව

**පියවර 2** :

- සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කොට ගවේෂණ පත්‍රිකා බෙදා දී, අදාළ ක්‍රියාකාරකමෙහි නිරත කරවන්න.

**පියවර 3** :

- කණ්ඩායම් අනාවරණ පන්තියට ඉදිරිපත් කිරීමට හා ඌන පූරණ හෝ සංවර්ධනාත්මක යෝජනා සඳහා සිසුන්ට අවස්ථාව ලබා දෙමින් පහත සඳහන් කරුණු ද මතු කරමින් සමාලෝචනයක යෙදෙන්න.
  - ජාති ආගම් කුල ගෝත්‍ර වශයෙන් නොබෙදී සියලු දෙනා සමග සහයෝගයෙන් කටයුතු කිරීම සහජීවනය බව
  - අන්‍යාගමිකයන් සමග සුහදතාවෙන් එම ආගම්වලට ද ගරු කරමින් කටයුතු කිරීම බෞද්ධ ආගමික සහනශීලීත්වය බව
  - ආගමික සහනශීලීත්වයට බුදු සිරිතෙන් උදාහරණ රැසක් ඉදිරිපත් කළ හැකි බව
  - බුදු සිරිතේ ආදර්ශය අනුව ශ්‍රී ලාංකික ජන සමාජය ආගමික සහනශීලීත්වයෙන් හා සහජීවනයෙන් ක්‍රියා කොට ඇති බව
  - සහජීවනයෙන් හා සහනශීලිත්වයෙන් යුතුව කටයුතු කිරීම උසස් මානව ගුණාංගයක් බව
  - කුඩා කල සිට ම අප ද මෙම ගුණ ධර්මවලට අනුගතව ක්‍රියා කළ යුතු බව

**ගුණාත්මක යෙදවුම්** : මෙම ගුරු මාර්ගෝපදේශයේ උපදෙස් පිළිපදිමින් ගුරුභවතාගේ අභිමතය පරිදි යොදා ගත හැකි ය.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

නිපුණතා මට්ටමට අදාළ ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණ මැන බැලීමට සුදුසු ආකාරයේ නිර්ණායක සකස් කර ගැනීමට ගුරු භවතාට නිදහස ඇත.

**ගවේෂණ පත්‍රිකාව** :

කණ්ඩායම 1. ආගමික සහනශීලීත්වය හා සහජීවනය බුදු සිරිත තුළ මූර්තිමත් වන ආකාරය නිදසුන් සහිත ව ඉදිරිපත් කරන්න.

කණ්ඩායම 2. ශ්‍රී ලාංකික ජන සමාජය ඇසුරින් ආගමික සහනශීලීත්වය සහ සහජීවනය ප්‍රදර්ශනය වන ආකාරය පහත සඳහන් අවස්ථා ඇසුරින් පැහැදිලි කරන්න.

1. එළාර රජතුමාගේ සොහොනට ගරු කිරීම
2. පොළොන්නරු පටිමාඝර
3. දළදා මාලිගාව ආශ්‍රිත සතර දේවාල ඉදිවීම

කණ්ඩායම 3. ආගමික සහනශීලී බවින් හා සහජීවනයෙන් කටයුතු කිරීමට ඔබට ගත හැකි ක්‍රියාමාර්ග නිදසුන් සහිත ව දක්වන්න.

**ගෙදර පරිසරයෙන්** :

අන්‍යාගමික ස්ථාන වෙත ගොස් එහි කටයුතු පිළිබඳ ව දැනුමක් දරුවාට ලබා දෙන්න.

**නිපුණතාව 06** : බුදු දහමට අනුව ජීවිතය හා ලෝකය හැඳින ගෙන ප්‍රඥාවන්ත ජීවිතයක් ගත කරයි.

**නිපුණතා මට්ටම 8.6.1** : **දුක පිළිබඳ බෞද්ධ විග්‍රහය තේරුම් ගෙන දුක්ඛිත අවස්ථාවන්ට නුවණින් හා වීර්යයෙන් මුහුණ දෙමින් දුක්ඛිතයන්ට පිහිටවීම.**

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02යි.

**ඉගෙනුම් පල** :

- දුක්ඛ ආර්ය සත්‍යය පැහැදිලි කරයි.
- දුක්ඛිත තත්වයන්හි දී නුවණින් හා වීර්යයෙන් ඊට මුහුණ දිය යුතු බව පිළිගනියි.
- දෛනික ජීවිතයේ දී මුහුණ දීමට සිදුවන දුක්ඛිත අවස්ථාවන් ලැයිස්තු ගත කරයි.
- දුක්ඛිත අවස්ථාවන්හි දී නුවණින් හා වීර්යයෙන් කටයුතු කරයි.
- දුක්ඛිතයන්ට පිහිට වෙයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්** :

දුක පිළිබඳ බෞද්ධ විග්‍රහය තේරුම් ගෙන දුක්ඛිත අවස්ථාවලට නුවණින් හා වීර්යයෙන් මුහුණදීමටත්, දුක්ඛිතයන්ට පිහිටවීමටත් දරුවන් යොමු කිරීම මෙම පාඩමෙන් අපේක්ෂිත ය.

**පියවර 1** :

''කලෙකිනි බුදු කෙනෙකුන් උපදින්නේ
දුකෙකිනි මිනිසත් බව ලැබ ගන්නේ
මෙදෙකිනි මෙසසර දුක් දුර ලන්නේ
සුදනෙනි කිම වීරිය නොකරන්නේ ''

යන කවිය සිසුන් සමග ගායනා කරන්න. පහත සඳහන් කරුණු මතු කරමින් සාකච්ඡාවක යෙදෙන්න.

- මෙම කවිය ලෝවැඩ සඟරාවේ ඇතුළත් වන බව
- මිනිසත් භාවය ලැබීම දුර්ලභ සිදුවීමක් බව
- මිනිසත් භාවය දුක් විඳ ලබාගත යුතු අසීරු තත්ත්වයක් බව
- දුක බුදු දහමේ මැනවින් පැහැදිලි කෙරෙන බව
- දුක පිළිබඳ ව දුක්ඛ ආර්ය සත්‍යයෙන් පැහැදිලි කරන බව

**පියවර 2** :

- සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කොට ගවේෂණ පත්‍රිකා බෙදා දී, අදාළ ක්‍රියාකාරකමෙහි නිරත කරවන්න.

**පියවර 3** :

- කණ්ඩායම් අනාවරණ පන්තියට ඉදිරිපත් කිරීමට හා ඌන පූරණ හෝ සංවර්ධනාත්මක යෝජනා සඳහා සිසුන්ට අවස්ථාව ලබා දෙමින් පහත සඳහන් කරුණු ද මතු කරමින් සමාලෝචනයක යෙදෙන්න.
    - දුක්ඛ ආර්ය සත්‍යය, චතුරාර්ය සත්‍යයේ පළමුවැන්න බව
    - දුක්ඛ දුක්ඛ, විපරිනාම දුක්ඛ, සංඛාර දුක්ඛ වශයෙන් දුක තුන් ආකාර වන බව
    - දම්සක් පැවතුම් සූත්‍රයට අනුව අංග අටකින් දුක්ඛ ආර්ය සත්‍යය දක්වා ඇති බව
    - ජීවිතයේ දුක් සහගත අවස්ථා රැසක් ඇති බව
    - දුක්ඛිත අවස්ථාවලට නුවණින් හා වීර්යෙන් මුහුණ දිය යුතු බව
    - දුක්ඛිතයන්ට පිහිට විය යුතු බව

**ගුණාත්මක යෙදවුම්** : මෙම ගුරු මාර්ගෝපදේශයේ උපදෙස් පිළිපදිමින් ගුරුභවතාගේ අභිමතය පරිදි යොදා ගත හැකි ය.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

නිපුණතා මට්ටමට අදාළ ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණ මැන බැලීමට සුදුසු ආකාරයේ නිර්ණායක සකස් කර ගැනීමට ගුරු භවතාට නිදහස ඇත.

**ගවේෂණ පත්‍රිකාව** :

| | |
|---|---|
| කණ්ඩායම 1. | දුක්ඛ ආර්ය සත්‍යය පැහැදිලි කරන්න. |
| කණ්ඩායම 2. | දෛනික ජීවිතයේ දී මුහුණ දීමට සිදුවන දුක් කම්කටොළුවලට ඔබ දිරියෙන් හා නුවණින් යුතුව මුහුණ දෙන ආකාරය පැහැදිලි කරන්න. |
| කණ්ඩායම 3. | දම්සක් පැවතුම් සූත්‍රයේ දැක්වෙන දුක්වලට ගොදුරු වූවන්ට පිහිට වන ආකාරය පැහැදිලි කරන්න. |

**ගෙදර පරිසරයෙන්** :

එදිනෙදා ජීවිතයේ දී මුහුණ දීමට සිදුවන දුක්ඛිත අවස්ථාවලට නුවණින් හා වීර්යෙන් දරුවන් සමඟ මුහුණ දෙන්න.

**නිපුණතාව 06 :** බුදු දහමට අනුව ජීවිතය හා ලෝකය හැඳින ගෙන ප්‍රඥාවන්ත ජීවිතයක් ගත කරයි.

**නිපුණතා මට්ටම 8.6.2 : දුකට ප්‍රධාන හේතුව තෘෂ්ණාව බව පිළිගෙන අල්පේච්ඡතාවෙන් කටයුතු කරයි.**

**කාලච්ඡේද සංඛ්‍යාව :** 02යි.

**ඉගෙනුම් පල :**

- දුක්ඛ සමුදය ආර්ය සත්‍යය පැහැදිලි කරයි.
- තෘෂ්ණාව පාලනය කරගෙන අල්පේච්ඡතාවෙන් කටයුතු කිරීමේ අගය පිළිගනියි.
- ''තෘෂ්ණාව සියලු දුකට හේතු වේ.'' යන මාතෘකාව යටතේ ලිපියක් සකස් කරයි.
- බහු භාණ්ඩික බවින් මිදී කටයුතු කරයි.
- තෘෂ්ණාවට දාස නොවී කටයුතු කිරීමට හුරු වෙයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස් :**

දුකට ප්‍රධාන හේතුව තෘෂ්ණාව බව පිළිගෙන අල්පේච්ඡතාවෙන් කටයුතු කිරීමට සිසුන් යොමු කිරීම මෙම පාඩමෙන් අපේක්ෂිත ය.

**පියවර 1 :**

- අසීමිත තෘෂ්ණාවේ පල විපාක දැක්වෙන පුවත්පත් වාර්තා හා පින්තූර කීපයක් දරුවන්ට පෙන්වා ඒ පිළිබඳව විමසා පහත සඳහන් කරුණු මතු කරමින් සාකච්ඡාවක් මෙහෙයවන්න.
  - ඉහත තොරතුරු මෑතකාලීන සිදුවීම් බව
  - තෘෂ්ණාව හේතු කොටගෙන විවිධ අවස්ථාවන්හි දී මිනිසුන් කරදරයට පත් වන බව
  - දැඩි තෘෂ්ණාව හේතු කොට ගෙන ජීවිත පවා විනාශ වන බව
  - දුක්ඛ සමුදය ආර්ය සත්‍යය චතුරාර්ය සත්‍යයේ දෙවන අංගය බව

**පියවර 2 :**

- සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කොට ගවේෂණ පත්‍රිකා බෙදා දී, අදාළ ක්‍රියාකාරකමෙහි නිරත කරවන්න.

**පියවර 3 :**

- කණ්ඩායම් අනාවරණ පන්තියට ඉදිරිපත් කිරීමට හා ඌන පූරණ හෝ සංවර්ධනාත්මක යෝජනා සඳහා සිසුන්ට අවස්ථාව ලබා දෙමින් පහත සඳහන් කරුණු ද මතු කරමින් සමාලෝචනයක යෙදෙන්න.
  - චතුරාර්ය සත්‍යයට අනුව දුක්ඛ සමුදය ලෙස තෘෂ්ණාව ඉදිරිපත් කෙරෙන බව
  - තෘෂ්ණාව කාම තණ්හා, භව තණ්හා, විභව තණ්හා වශයෙන් කොටස් තුනකින් පැහැදිලි කෙරෙන බව
  - තෘෂ්ණාව සියලු දුකට හේතු වන බව
  - තෘෂ්ණාව පාලනය කිරීමෙන් අල්පේච්ඡ ජීවිතයක් ගත කළ හැකි බව
  - අල්පේච්ඡ පුද්ගලයා සතුටින් කාලය ගත කරන බව
  - නිවන් ලැබීම පිණිස තෘෂ්ණාව නැති කළ යුතු බව

**ගුණාත්මක යෙදවුම්** : මෙම ගුරු මාර්ගෝපදේශයේ උපදෙස් පිළිපදිමින් ගුරුභවතාගේ අභිමතය පරිදි යොදා ගත හැකි ය.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

නිපුණතා මට්ටමට අදාළ ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණ මැන බැලීමට සුදුසු ආකාරයේ නිර්ණායක සකස් කර ගැනීමට ගුරු භවතාට නිදහස ඇත.

**ගවේෂණ පත්‍රිකාව** :

කණ්ඩායම 1. කාම, භව, විභව යන ත්‍රිවිධ තණ්හා වෙන වෙන ම හඳුන්වන්න.

කණ්ඩායම 2. ''තෘෂ්ණාව සියලු දුකට හේතු වේ'' යන මාතෘකාව යටතේ ලිපියක් සකසන්න.

කණ්ඩායම 3. අල්පේච්ඡතාවෙන් කටයුතු කිරීමෙන් ජීවිත ජය ගත හැකි ආකාරය පැහැදිලි කරන්න.

**ගෙදර පරිසරයෙන්** :

හැකි සෑම විට ම බෙදා හදා ගෙන කටයුතු කිරීමටත්, ලද දෙයින් සතුටු වීමටත් දරුවන් හා එක්ව කටයුතු කරන්න.

**නිපුණතාව 06 :** බුදු දහමට අනුව ජීවිතය හා ලෝකය හැඳින ගෙන ප්‍රඥාවන්ත ජීවිතයක් ගත කරයි.

**නිපුණතා මට්ටම 8.6.3 : බුදු දහමෙහි ඉගැන්වෙන කර්මය හැඳින නිවැරදි ව කටයුතු කරයි.**

**කාලච්ඡේද සංඛ්‍යාව :** 02යි.

**ඉගෙනුම් පල :**

- බුදු දහමෙහි ඉගැන්වෙන කර්ම සංකල්පය පැහැදිලි කරයි.
- සියල්ල කර්ම විපාක වශයෙන්ම සිදු නොවන බව පිළිගනියි.
- බුදු දහමෙහි ඉගැන්වෙන කර්ම සංකල්පය පිළිබඳ අන්‍යාගමික මිතුරෙකුට ලිපියක් ලියයි.
- නිවැරදි ක්‍රියාවන්හි යෙදෙයි.
- කර්මපල විශ්වාසයෙන් කටයුතු කරයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස් :**

බුදු දහමේ ඉගැන්වෙන කර්මය හැඳින නිවැරදි ජීවිතයක් ගත කිරීමට දරුවන් පෙලඹවීම මෙම පාඩමෙන් අපේක්ෂිත ය.

**පියවර 1 :**

''මනෝ පුබ්බංගමා ධම්මා

මනෝ සෙට්ඨා මනෝමයා

මනසා චෙ පදුට්ඨෙන

භාසති වා කරෝති වා

තතෝ නං දුක්ඛමන්වෙති

චක්කංව වහතො පදං''

යන ධම්ම පද ගාථාව සිසුන් සමග සජ්ඣායනා කරන්න. පහත සඳහන් කරුණු මතු කරමින් සාකච්ඡාවක් මෙහෙයවන්න.

- මෙම ගාථාව ධම්ම පදයෙහි මුල්ම ගාථාව බව
- නරක සිතින් කරන ක්‍රියාවන්ගේ ප්‍රතිඵලය ගැල අදින ගොනා පසු පස එන කරත්ත රෝදය මෙන් තමා පසු පස පැමිණේය යන්න මෙම ගාථාවේ අදහස බව
- චේතනාව මුල් වී කයෙන්, වචනයෙන් සහ මනසින් සිදුවන දේ කර්ම බව

**පියවර 2 :**

- සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කොට ගවේෂණ පත්‍රිකා බෙදා දී, අදාළ ක්‍රියාකාරකමෙහි නිරත කරවන්න.

**පියවර 3 :**

- කණ්ඩායම් අනාවරණ පන්තියට ඉදිරිපත් කිරීමට හා ඌන පූරණ හෝ සංවර්ධනාත්මක යෝජනා සඳහා සිසුන්ට අවස්ථාව ලබා දෙමින් පහත සඳහන් කරුණු ද මතු කරමින් සමාලෝචනයක යෙදෙන්න.

- කර්මය බුදු දහමේ ප්‍රධාන ඉගැන්වීමක් බව
- කරනු ලබන හොඳ නරක ක්‍රියාවලට අනුරූප විපාක ලැබීම කර්මය පිළිබඳ ඉගැන්වීමෙන් පැහැදිලි කෙරෙන බව
- සියල්ලම සිදුවන්නේ කර්ම විපාක වශයෙන් නොවන බව
- අයහපත් ක්‍රියාවලින් වැළකී යහපත් ක්‍රියාවල නිරත විය යුතු බව

**ගුණාත්මක යෙදවුම්** : මෙම ගුරු මාර්ගෝපදේශයේ උපදෙස් පිළිපදිමින් ගුරුභවතාගේ අභිමතය පරිදි යොදා ගත හැකි ය.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

නිපුණතා මට්ටමට අදාළ ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණ මැන බැලීමට සුදුසු ආකාරයේ නිර්ණායක සකස් කර ගැනීමට ගුරු භවතාට නිදහස ඇත.

**ගවේෂණ පත්‍රිකාව** :

කණ්ඩායම 1. පුද්ගලයා විසින් කරනු ලබන කර්මයට අනුව විපාක විදීමට සිදුවන අකාරය නිදසුන් මගින් පෙන්වන්න.

කණ්ඩායම 2. බුදුදහමේ ඉගැන්වෙන කර්මය පිළිබඳව අන්‍යාගමික මිතුරෙකුට ලිපියක් ලියන්න.

**ගෙදර පරිසරයෙන්** :

කර්මානුරූපීව ඵල විපාක ලබා දෙන කතා පුවත් දරුවාට කියා දෙන්න.

**නිපුණතාව 07 : ජීවී අජීවී පරිසරයට හිතකාමී ව හැසිරෙයි.**

**නිපුණතා මට්ටම 8.7.1 : සියලු ජීවීන් සමග සහකම්පනයෙන් කටයුතු කරයි.**

**කාලච්ඡේද සංඛ්‍යාව : 02යි.**

**ඉගෙනුම් පල :**

- කෝසල සංයුක්තයේ එන මල්ලිකා සූත්‍රයෙහි සාරාංශය ඉදිරිපත් කරයි.
- සියලු ජීවීන් සමග සහකම්පනයෙන් කටයුතු කළ යුතු බව පිළිගනියි.
- සහකම්පනයෙන් කටයුතු කරන අවස්ථාවක් භූමිකා රංගනයකින් පෙන්වයි.
- පොදු සම්පත් ආරක්ෂා කරයි.
- ජීව දයාවෙන් යුතුව කටයුතු කරයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස් :**

සියලු ජීවීන් සමග සහකම්පනයෙන් කටයුතු කිරීමට සිසුන් යොමු කිරීම මෙම පාඩමෙන් අපේක්ෂිත ය.

**පියවර 1 :**

- අන් අය කෙරෙහි හිතවත්කම පතුරුවන භාවනාව කුමක් දැයි සිසුන්ගෙන් විමසන්න. පහත සඳහන් කරුණු මතු කරමින් සාකච්ඡාවක් මෙහෙයන්න.
  - හිතවත්කම පතුරු වන්නේ මෛත්‍රී භාවනාවෙන් බව
  - එම භාවනාවේ ආරම්භක පියවර තමාට මෛත්‍රිය දැක්වීම බව
  - තමාගෙන් ආරම්භ වී සියලු ලෝවැසියන්ට මෙත් වැඩීමට මෙම භාවනාවෙන් ඉගැන්වෙන බව
  - තමාට මෙන්ම අන් අයට ද මෙත් වඩන්නා තුළ සහකම්පනය ඇති වන බව

**පියවර 2 :**

- සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කොට ගවේෂණ පත්‍රිකා බෙදා දී, අදාළ ක්‍රියාකාරකමෙහි නිරත කරවන්න.

**පියවර 3 :**

- කණ්ඩායම් අනාවරණ පන්තියට ඉදිරිපත් කිරීමට හා ඌන පූරණ හෝ සංවර්ධනාත්මක යෝජනා සඳහා සිසුන්ට අවස්ථාව ලබා දෙමින් පහත සඳහන් කරුණු ද මතු කරමින් සමාලෝචනයක යෙදෙන්න.
  - අන් අයගේ කරදර විපත් තමාට ම සිදුවූ දෙයක් මෙන් සිතා ඊට උපකාර කිරීමට ඉදිරිපත් වන සිතිවිල්ල සහකම්පනය බව
  - තමා වඩාත් ප්‍රිය කරන්නේ තමාට ම බව
  - මෙය මල්ලිකා බිසව කොසොල් රජුට දුන් පිළිතුරෙන් ද තහවුරු වන බව
  - බුදු දහමට අනුව මල්ලිකා බිසවගේ ප්‍රකාශය යථාර්ථයක් බව

- සහකම්පනයෙන් කටයුතු කිරීමේ ප්‍රයෝජන රැසක් ඇති බව
- අන් සතු හා පොදු සම්පත් සුරැකීම ද ජීව හිතවාදී අකල්පයක් බව
- පාසල් සිසුන් වශයෙන් සහකම්පනයෙන් කටයුතු කිරීමට අදිටන් කරගත යුතු බව

**ගුණාත්මක යෙදවුම්** : මෙම ගුරු මාර්ගෝපදේශයේ උපදෙස් පිළිපදිමින් ගුරුභවතාගේ අභිමතය පරිදි යොදා ගත හැකි ය.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

නිපුණතා මට්ටමට අදාළ ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණ මැන බැලීමට සුදුසු ආකාරයේ නිර්ණායක සකස් කර ගැනීමට ගුරු භවතාට නිදහස ඇත.

**ගවේෂණ පත්‍රිකාව** :

කණ්ඩායම 01 : මල්ලිකා සූත්‍රයෙහි දැක්වෙන කථා පුවත පන්තියට ඉදිරිපත් කරන්න.

කණ්ඩායම 02 : සහකම්පනයෙන් කටයුතු කරන අවස්ථාවක් නාට්‍යානුසාරයෙන් ඉදිරිපත් කරන්න.

කණ්ඩායම 03 : සහකම්පනයෙන් කටයුතු කිරීම නිසා සැලසෙන ප්‍රයෝජන නම් කොට ඉන් එක් ප්‍රයෝජනයක් නිදසුන් සහිත ව ඉදිරිපත් කරන්න.

කණ්ඩායම 04 : පොදු සම්පත් හා අන් සතු දේ ආරක්ෂා කිරීමට ඔබට කළ හැකි දේ ලියන්න.

**ගෙදර පරිසරයෙන්** :

පොදු දේපොළ හා සියලු සතුන් ආරක්ෂා කිරීමටත්, අසල්වැසියන් සමග සහයෝගයෙන් කටයුතු කිරීමටත් දරුවන් යොමු කරන්න.

**නිපුණතාව 07 :** ජීවි අජීවී පරිසරයට හිතකාමී ව හැසිරෙයි.

**නිපුණතා මට්ටම 8.7.2 : බුදුසිරිත තුරුලතා හා බැඳී ඇති බව දැන ගහකොළ සංරක්ෂණයට දායක වෙයි.**

**කාලච්ඡේද සංඛ්‍යාව :** 02යි

**ඉගෙනුම් පල :**

- බුදු සිරිත තුරුලතා හා බැඳී ඇති බවට නිදසුන් සපයයි.
- සියලු සතුන්ගේ පැවැත්මට තුරුලතා මහෝපකාරී වන බව පිළිගනියි.
- පාසල් භූමියෙහි නිශ්චිත ස්ථානයක රුක් රෝපණයට හා සංරක්ෂණයට යෝග්‍ය සැලැස්මක් සකසයි.
- පරිසර සංරක්ෂණයට දායක වෙයි.
- පරිසරයට ආදරය කරයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස් :**

බුදු සිරිත තුරුලතා හා බැඳී ඇති බව දැන ගහ කොළ සංරක්ෂණයට දරුවන් යොමු කිරීම මෙම පාඩමෙන් අපේක්ෂිත ය.

**පියවර 1 :**

- පාසල් වත්තේ හෝ ආසන්නයේ අතු පතර විහිදී ගිය තුරු සෙවනකට දරුවන් සියලු දෙනා රැගෙන යන්න. පහත සඳහන් කරුණු මතු කරමින් සාකච්ඡාවක් මෙහෙයවන්න.
- පන්ති කාමරයෙහි හා තුරු සෙවනෙහි වෙනසක් පවතින බව
- ගසෙහි ඇති ජලවාෂ්ප හේතුවෙන් සිසිලසක් දැනීම එම වෙනසට හේතුව බව
- අපට ජීවත්වීම සඳහා අවශ්‍ය වාතය ලබාදීම ගහකොළින් සිදුවන බව
- තුරුලතා හා අප ජීවිත එකිනෙක බැඳී පවතින බව

**පියවර 2 :**

- සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කොට ගවේෂණ පත්‍රිකා බෙදා දී, අදාළ ක්‍රියාකාරකමෙහි නිරත කරවන්න.

**පියවර 3 :**

- කණ්ඩායම් අනාවරණ පන්තියට ඉදිරිපත් කිරීමට හා ඌන පූරණ හෝ සංවර්ධනාත්මක යෝජනා සඳහා සිසුන්ට අවස්ථාව ලබා දෙමින් පහත සඳහන් කරුණු ද මතු කරමින් සමාලෝචනයක යෙදෙන්න.
  - බුදු සිරිත තුරුලතා හා බැඳී පැවතින බව
  - සත්ත්ව ජීවිත රැඳී පවතින්නේ ගහ කොළ මත බව
  - තුරුලතා විනාශ කිරීම මිත්‍රද්‍රෝහී ක්‍රියාවක් බව
  - හැකි හැමවිට ම රුක් රෝපණය කළ යුතු බව
  - තුරුලතා සංරක්ෂණය කළ යුතු බව

**ගුණාත්මක යෙදවුම්** : මෙම ගුරු මාර්ගෝපදේශයේ උපදෙස් පිළිපදිමින් ගුරුභවතාගේ අභිමතය පරිදි යොදා ගත හැකි ය.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

නිපුණතා මට්ටමට අදාළ ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණ මැන බැලීමට සුදුසු ආකාරයේ නිර්ණායක සකස් කර ගැනීමට ගුරු භවතාට නිදහස ඇත.

**ගවේෂණ පත්‍රිකාව** :

කණ්ඩායම 1. සියලු ජීවීන්ගේ පැවැත්ම තුරුලතා මත රැඳී පවතින බවට කරුණු ඉදිරිපත් කරන්න.

කණ්ඩායම 2. පාසල් භූමියේ නිශ්චිත ස්ථානයක රුක් රෝපණයට හා සංරක්ෂණයට සුදුසු සැලැස්මක් සකස් කරන්න.

කණ්ඩායම 3. බුදු සිරිත තුරුලතා හා බැඳී පැවති බවට නිදසුන් ගෙනහැර දක්වන්න.

**ගෙදර පරිසරයෙන්** :

තම නිවෙස් පරිසරයේ ඇති ගහ කොළ හා පස රැක බලා ගැනීමටත්, පැළ සිටුවීමටත් සංරක්ෂණයටත් දරුවන් සමග යොමු වන්න.

**නිපුණතාව 08** : ශාසන ඉතිහාසය හා ශ්‍රී ලාංකික බෞද්ධ උරුමය හැඳින එම උරුමය රැක ගැනීමට ක්‍රියා කරයි.

**නිපුණතා මට්ටම 8.8.1** : **පළමු ධර්ම සංගායනාව අධ්‍යයනය කර,අර්බුද හා ගැටුම් නිරාකරණය කර ගනී.**

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02යි.

**ඉගෙනුම් පල** :

- ප්‍රථම ධර්ම සංගායනාව පිළිබඳ ව කරුණු පැහැදිලි කරයි.
- ගැටලු සාකච්ඡා මාර්ගයෙන් විසඳා ගත හැකි බව පිළිගනියි.
- ප්‍රථම ධර්ම සංගායනාව හා බැඳුණු වැදගත් කරුණු වගු ගත කරයි.
- සාකච්ඡාවෙන් ගැටුම් නිරාකරණය කර ගනියි.
- සාමයෙන් සමගියෙන් ජීවත් වෙයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්** :

ප්‍රථම ධර්ම සංගායනාව අධ්‍යයනය කර අර්බුද හා ගැටුම් නිරාකරණය කර ගැනීමට සිසුන්ට මග පෙන්වීම මෙම පාඩමෙන් අපේක්ෂිත ය.

**පියවර 1** :

- සුභද්‍ර භික්ෂු නමගේ අහිතවත් වූ ප්‍රකාශය වන ''නොහඬන්න. නොවැළපෙන්න. අප ඒ මහා ශ්‍රමණයාගෙන් මිදුනෝ වම්හ'' යන්න සිසුන්ට ඉදිරිපත් කොට පහත සඳහන් පරිදි සාකච්ඡාව මෙහෙයවන්න.
- බුදුරජාණන් වහන්සේගේ පිරිනිවීම අසා සුභද්‍ර නම් වූ භික්ෂු නම මෙම ප්‍රකාශය කළ බව
- මහා කාශ්‍යප මහරහත් හිමිගේ දැඩි අවධානය ඒ සම්බන්ධයෙන් යොමු වූ බව
- එහි ප්‍රතිඵලය ලෙස ප්‍රථම ධර්ම සංගායනාව පැවැත් වූ බව

**පියවර 2** :

- සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කොට කලින් ලබාදුන් ගවේෂණ පත්‍රිකා ගැන සිහිපත් කර අදාළ ක්‍රියාකාරකමෙහි නිරත කරවන්න.

**පියවර 3** :

- කණ්ඩායම් අනාවරණ පන්තියට ඉදිරිපත් කිරීමට හා ඌන පූරණ හෝ සංවර්ධනාත්මක යෝජනා සඳහා සිසුන්ට අවස්ථාව ලබා දෙමින් පහත සඳහන් කරුණු ද මතු කරමින් සමාලෝචනයක යෙදෙන්න.
    - සුභද්‍ර භික්ෂු නමගේ නොමනා ප්‍රකාශය ප්‍රථම සංගායනාවට හේතු වූ බව
    - මේ සඳහා බලපෑ වෙනත් හේතු ද ඇති බව
    - බුදුරජාණන් වහන්සේ පිරිනිවන් පා තෙමසක් ඇවෑමෙන්, රජගහනුවර වේභාර පර්වත ප්‍රාන්තයේ සප්තපර්ණී ගුහාව ඉදිරිපිට කරවන ලද මණ්ඩපයක සංගායනාව පවත්වන ලද බව

- මහා කාශ්‍යප රහතන් වහන්සේගේ ප්‍රධානත්වයෙන් පැවැති සංගායනාවට අජාසත්ත රජු අනුග්‍රහය දක්වූ බව
- මාස 07ක කාලයක් පැවැති මෙම සංගායනාවට රහතන් වහන්සේලා 500ක් සහභාගී වූ නිසා එය **පංච සතිකා** නමින් හැඳින්වෙන බව
- විනය, සූත්‍ර වශයෙන් ධර්මය සංගායනා වූ බව
- විනය පිටකය කාණ්ඩ පහකට ද, සූත්‍ර පිටකය කාණ්ඩ පහකට ද බෙදා ශිෂ්‍යානුශිෂ්‍ය පරම්පරා මගින් ඉදිරියට පවත්වා ගැනීමට උපදෙස් ලැබුණ බව
- ප්‍රථම ධර්ම සංගායනාවේ ප්‍රතිඵල බුදු සසුන සුරක්ෂිත කිරීමට ඉවහල් වූ බව
- ප්‍රථම සංගායනාව පැවැත්වීමේ දී අනුගමනය කළ ක්‍රියාමාර්ග වත්මන් ගැටලු විසඳා ගැනීමට ද ආදර්ශ කොට ගත හැකි බව

**ගුණාත්මක යෙදවුම්** : මෙම ගුරු මාර්ගෝපදේශයේ උපදෙස් පිළිපදිමින් ගුරුභවතාගේ අභිමතය පරිදි යොදා ගත හැකි ය.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

නිපුණතා මට්ටමට අදාළ ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණ මැන බැලීමට සුදුසු ආකාරයේ නිර්ණායක සකස් කර ගැනීමට ගුරු භවතාට නිදහස ඇත.

**ගවේෂණ පත්‍රිකාව** :

කණ්ඩායම 1. ප්‍රථම ධර්ම සංගායනාව පැවැත්වීමට හේතු වූ කරුණු හා සංගායනාවේ සංවිධානය ලියා දක්වන්න.

කණ්ඩායම 2. ප්‍රථම ධර්ම සංගායනාවෙන් ලැබුණ ප්‍රතිඵල වගුගත කරන්න.

කණ්ඩායම 3. ප්‍රථම ධර්ම සංගායනාවේ දී අනුගමනය කළ ක්‍රියාමාර්ග වත්මන් ගැටලු නිරාකරණයට යොදාගත හැකි ආකාරය පැහැදිලි කරන්න.

**ගෙදර පරිසරයෙන්** :

එදිනෙදා ගැටලු දරුවන් සමග සාකච්ඡා කොට විසඳා ගැනීමට කටයුතු කරන්න.

**නිපුණතාව 08 :** ශාසන ඉතිහාසය හා ශ්‍රී ලාංකික බෞද්ධ උරුමය හැඳින එම උරුමය රැක ගැනීමට ක්‍රියා කරයි.

**නිපුණතා මට්ටම 8.8.2 : දළදා පුරා වෘත්තය හා දළදා පුද සිරිත් ඉගෙන එම පුද සිරිත් සුරැකීමට ක්‍රියා කරයි.**

**කාලච්ඡේද සංඛ්‍යාව :** 02යි.

**ඉගෙනුම් පල :**

- දළදා පුරා වෘත්තය හා දළදා පුද සිරිත් විස්තර කරයි.
- දළදා වත හා බැඳුණු පුද සිරිත් රැක ගත යුතු බව පිළිගනියි.
- දළදා වහන්සේ, දළදා වත, දළදා පෙරහැර යන මාතෘකා යටතේ පුවත් පතකට ලිපි ලිවීමට කරුණු ගොනු කරයි.
- ආගමික පුද සිරිත් ආරක්ෂා කරයි.
- පෞරාණික දේ රැක ගනියි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස් :**

දළදා පුරා වෘත්තය හා දළදා පුද සිරිත් ඉගෙනීමට සහ එම පුද සිරිත් සුරැකීමට දරුවා යොමු කිරීම මෙම පාඩමෙන් අපේක්ෂිත ය.

**පියවර 1 :**

'' මගේ රටට දළදා හිමි සරණයි

මගේ දූයට දළදා හිමි සරණයි

සැපතින් සපිරුණු නිවහල් දෙරණයි

උපතින් මා හට මේ හැම උරුමයි''

මෙම ගීතය සිසුන් සමග ගායනා කරන්න. පහත සඳහන් කරුණු ද මතු කරමින් සාකච්ඡාවක යෙදෙන්න.

- දළදා වහන්සේ ගැන මෙම ගීතයෙන් කියැවෙන බව
- දළදා වහන්සේගේ පිහිට ප්‍රාර්ථනා කරන්නන්ට එය ලැබෙන බව
- දළදා වහන්සේ බෞද්ධයාගේ මුදුන් මල්කඩ බව
- දළදා වහන්සේ හා බැඳුණු පුද සිරිත් රාශියක් ඇති බව
- දළදා වන්දනාවේ දී පුද සිරිත් නිවැරදි ව අනුගමනය කළ යුතු බව

**පියවර 2 :**

- සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කොට කලින් ලබාදුන් ගවේෂණ පත්‍රිකා ගැන සිහිපත් කර අදාළ ක්‍රියාකාරකමෙහි නිරත කරවන්න.

**පියවර 3** :

- කණ්ඩායම් අනාවරණ පන්තියට ඉදිරිපත් කිරීමට හා ඌන පූරණ හෝ සංවර්ධනාත්මක යෝජනා සඳහා සිසුන්ට අවස්ථාව ලබා දෙමින් පහත සඳහන් කරුණු ද මතු කරමින් සමාලෝචනයක යෙදෙන්න.
    - දළදා වහන්සේ මහනුවර දළදා මාලිගයෙහි වැඩ සිටින බව
    - දළදා වහන්සේ හා බැඳුණු පුරාවෘත්ත ඇති බව
    - එම පුරා වෘත්ත දළදා වත, දාඨා වංශය ආදියෙහි විස්තර වන බව
    - දළදා වහන්සේ හා බැඳුණු පුද සිරිත් රාශියක් ඇති බව
    - දළදා වහන්සේ හා බැඳුණු සුවිශේෂී සංස්කෘතියක් අප අතර පවතින බව
    - අතීතයේ සිට ශ්‍රී ලංකාවේ රාජ්‍ය උරුමය හා දළදා වහන්සේ අතර සමීප සම්බන්ධයක් පැවති බව
    - දළදා වහන්සේ උදෙසා විශේෂ තේවාවන් පැවැත්වන බව
    - මල්වතු හා අස්ගිරි මහ නාහිමිවරු දළදා වහන්සේගේ භාරකාරත්වය දරණ බව
    - දළදා වහන්සේගේ ගිහි භාරකාරත්වය දියවඩන නිළමෙතුමාට හිමි වන බව
    - දළදා වහන්සේ හා බැඳුණු පුද සිරිත් රැක ගත යුතු බව

**ගුණාත්මක යෙදවුම්** : මෙම ගුරු මාර්ගෝපදේශයේ උපදෙස් පිළිපදිමින් ගුරුභවතාගේ අභිමතය පරිදි යොදා ගත හැකි ය.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

නිපුණතා මට්ටමට අදාළ ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණයන් මැන බැලීමට සුදුසු ආකාරයේ නිර්ණායක සකස් කර ගැනීමට ගුරු භවතාට නිදහස ඇත.

**ගවේෂණ පත්‍රිකාව** :

කණ්ඩායම 1. පහත මාතෘකාවලට අනුව පුවත් පතකට ලිපියක් සකස් කරන්න.
- සිරි දළදා වහන්සේ
- දළදා වත
- දළදා පෙරහැර

කණ්ඩායම 2. දළදා වහන්සේ වන්දනා කිරීමේ චාරිකාවක් සැලසුම් කොට චාරිත්‍රානුකූලව දළදා වන්දනා කරන ආකාරය පැහැදිලි කරන්න.

කණ්ඩායම 3. දළදා වහන්සේ වන්දනා කරන සැදැහැවතෙකු විසින් අනුගමනය කළ යුතු උපදෙස් පත්‍රිකාවක් සකසන්න.

**ගෙදර පරිසරයෙන්** :

දෛනික බුද්ධ වන්දනාවෙහි දී නිවැරදි පුද සිරිත් භාවිතයට දරුවා යොමු කරවන්න.

**නිපුණතාව 09 :** බෞද්ධ ආර්ථික හා රාජ්‍ය පාලන චින්තනය හැඳින ගෙන ඒ අනුව ක්‍රියා කරයි.

**නිපුණතා මට්ටම 8.9.1 : බුදු දහමට අනුව දැහැමි ධනෝපායන මාර්ග හා ධාර්මික පරිභෝජන රටාව හැඳින ඒ අනුව කටයුතු කරයි.**

**කාලච්ඡේද සංඛ්‍යාව :** 02යි.

**ඉගෙනුම් පල :**

- අණන සූත්‍රයට අනුව ධනෝපායනය හා ධන පරිහරණය කරන අයුරු පැහැදිලි කරයි.
- දැහැමි ධනෝපායන මාර්ග අනුගමනය කළ යුතු බව පිළිගනියි.
- ධනෝපායනය හා ධන පරිහරණය නිවැරදිව සිදු කිරීමට මගපෙන්වන උපදෙස් පත්‍රිකාවක් සකසයි.
- දැහැමි පරිභෝජන රටාවකට හුරු වෙයි.
- ධාර්මික රැකියාවක නිරත වෙමින් සුවදායී ජීවිතයක් ගත කරයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස් :**

බුදු දහමට අනුව දැහැමි ධනෝපායන මාර්ග හා දැහැමි පරිභෝජන රටාව හැඳින ඒ අනුව කටයුතු කිරීමට සිසුන් යොමු කිරීම මෙම පාඩමෙන් අපේක්ෂිත ය.

**පියවර 1 :**

- චුල්ල සෙට්ඨි ජාතකයෙහි සාරාංශය පන්තියට ඉදිරිපත් කරන්න. පහත සඳහන් කරුණු මතු කරමින් සාකච්ඡාවක් මෙහෙයවන්න.
  - උත්සාහයෙන් කටයුතු කොට දියුණුවට පත් පුද්ගලයෙකු පිළිබඳ තොරතුරු මෙම ජාතකයෙන් පැවසෙන බව
  - උත්සාහයෙන් ධාර්මිකව මිල මුදල් ඉපයීම ධාර්මික ධනෝපායනය බව

**පියවර 2 :**

- සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කොට ගවේෂණ පත්‍රිකා බෙදා දී, අදාළ ක්‍රියාකාරකමෙහි නිරත කරවන්න.

**පියවර 3 :**

- කණ්ඩායම් අනාවරණ පන්තියට ඉදිරිපත් කිරීමට හා ඌන පූරණ හෝ සංවර්ධනාත්මක යෝජනා සඳහා සිසුන්ට අවස්ථාව ලබා දෙමින් පහත සඳහන් කරුණු ද මතු කරමින් සමාලෝචනයක යෙදෙන්න.
  - බුදු දහමින් ධාර්මික ධනෝපායන මාර්ග අනුමත කෙරෙන බව
  - දැහැමි ධනෝපායන මාර්ග රැසක් ඇති බව
  - ධන පරිහරණයේ දී අනුගමනය කළ යුතු විධිමත් ක්‍රියා මාර්ග ඇති බව
  - ධාර්මික ධනෝපායනයෙන් හා විධිමත් පරිභෝජන රටාවෙන් බොහෝ ප්‍රයෝජන ලැබෙන බව
  - ධනයේ අවශ්‍යතාවය හා ධනය පරිභෝජනය කරන ආකාරය අනණ සූත්‍රය මගින් පැහැදිලි කරන බව

**ගුණාත්මක යෙදවුම්** : මෙම ගුරු මාර්ගෝපදේශයේ උපදෙස් පිළිපදිමින් ගුරුභවතාගේ අභිමතය පරිදි යොදා ගත හැකි ය.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

නිපුණතා මට්ටමට අදාළ ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණ මැන බැලීමට සුදුසු ආකාරයේ නිර්ණායක සකස් කර ගැනීමට ගුරු භවතාට නිදහස ඇත.

**ගවේෂණ පත්‍රිකාව** :

කණ්ඩායම 1. අනණ සූත්‍රයට අනුව දැහැමිව ධනය උපයන ආකාරය පැහැදිලි කරන්න.

කණ්ඩායම 2. ධර්මානුකූලව ධන පරිභෝජනයේ දී සැලකිලිමත් විය යුතු කරුණු ගොනුකර දක්වන්න.

කණ්ඩායම 3. ධාර්මික ධනෝපායනයෙන් හා විධිමත් පරිභෝජනයෙන් සැලසෙන ප්‍රයෝජන පෙන්වා දෙන්න

**ගෙදර පරිසරයෙන්** :

තම නිවසේ දී දරුවන් සමග නිවැරදි හා විධිමත් පරිභෝජන රටාවකට යොමුවන්න.

**නිපුණතාව 09** : බෞද්ධ ආර්ථික හා රාජ්‍ය පාලන චින්තනය හැඳින ගෙන ඒ අනුව ක්‍රියා කරයි.

**නිපුණතා මට්ටම 8.9.2** : **සප්ත අපරිහානීය ධර්ම අධ්‍යයනය කර සාමූහික වගකීමෙන් යුතු ව ක්‍රියා කරයි.**

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02යි.

**ඉගෙනුම් පල** :

- සප්ත අපරිහානීය ධර්ම පැහැදිලි කරයි.
- සප්ත අපරිහානීය ධර්ම අනුගමනයෙන් සාමූහිකව කටයුතු කළ හැකි බව පිළිගනියි.
- සප්ත අපරිහානීය ධර්ම ඇසුරින් යහපත් පාලනයක ලක්ෂණ ලැයිස්තු ගත කරයි.
- සාමූහික වගකීමෙන් යුතුව කටයුතු කරයි.
- පාලන නීතිරීතිවලට ගරු කරයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්** :

සප්ත අපරිහානීය ධර්ම අධ්‍යයනය කර සාමූහික වගකීමෙන් යුතු ව කටයුතු කරන්නට මග පෙන්වීම මෙම පාඩමෙන් අපේක්ෂිත ය.

**පියවර 1** :

'' අපි ඔක්කොම රජවරු

ඔක්කොම වැසියෝ

තුන් සිංහලයම නෑදෑයෝ ..............................''

යන ගීතය සිසුන් සමඟ ගායනා කොට පහත සඳහන් කරුණු මතු කරමින් සාකච්ඡාවක් මෙහෙයවන්න.

- ශ්‍රී ලාංකිකයන් වශයෙන් සාමූහිකව කටයුතු කිරීමේ වටිනාකම මින් කියවෙන බව
- සාමූහිකව කටයුතු කිරීමෙන් ජයග්‍රහණ ලද හැකි බව
- බුදුරජාණන් වහන්සේ සාමූහිකව කටයුතු කිරීම අගය කොට ඇති බව
- සාමූහිකව කටයුතු කිරීමේ වැදගත්කම සප්ත අපරිහානිය ධර්ම මගින් පෙන්වා දෙන බව

**පියවර 2** :

- සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කොට ගවේෂණ පත්‍රිකා බෙදා දී, අදාළ ක්‍රියාකාරකමෙහි නිරත කරවන්න.

**පියවර 3** :

- කණ්ඩායම් අනාවරණ පන්තියට ඉදිරිපත් කිරීමට හා ඌන පූරණ හෝ සංවර්ධනාත්මක යෝජනා සඳහා සිසුන්ට අවස්ථාව ලබා දෙමින් පහත සඳහන් කරුණු ද මතු කරමින් සමාලෝචනයක යෙදෙන්න.
  - බුදුරජාණන් වහන්සේගේ උපදෙස් මත ලිච්ඡවී රාජ්‍ය පාලකයන් සප්ත අපරිහානීය ධර්ම අනුගමනය කළ බව
  - සාමූහික බව හා වගකීම පිළිබඳ ව සප්ත අපරිහානීය ධර්ම මගින් අවධාරණය වන බව
  - දැහැමි පාලනයක් ගොඩනැගීමට මෙම ඉගැන්වීම් යොදාගත හැකි බව
  - යහපත් සමාජයක් ගොඩනැගීම සඳහා සප්ත අපරිහානීය ධර්ම උපයෝගී කරගත හැකි බව

**ගුණාත්මක යෙදවුම්** : මෙම ගුරු මාර්ගෝපදේශයේ උපදෙස් පිළිපදිමින් ගුරුභවතාගේ අභිමතය පරිදි යොදා ගත හැකි ය.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්** :

නිපුණතා මට්ටමට අදාළ ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණ මැන බැලීමට සුදුසු ආකාරයේ නිර්ණායක සකස් කර ගැනීමට ගුරු භවතාට නිදහස ඇත.

**ගවේෂණ පත්‍රිකාව** :

කණ්ඩායම 1. සප්ත අපරිහානීය ධර්ම කෙටියෙන් පැහැදිලි කරන්න.

කණ්ඩායම 2. දැහැමි පාලනයකට සප්ත අපරිහානීය ධර්ම යොදාගත හැකි ආකාරය පැහැදිලි කරන්න.

**ගෙදර පරිසරයෙන්** :

නිවසේ සියලු කාර්යයන්හි සහයෝගයෙන් නිරත වීමට දරුවන් යොමු කරන්න.

**නිපුණතාව 10 :** නිර්වාණය අරමුණු කොටගෙන ආර්ය මාර්ගයේ ගමන් කරයි.

**නිපුණතා මට්ටම 8.10.1 :** **ලෞකික, ලෝකෝත්තර දියුණුව සඳහා නිවැරදි දැක්මක් ඇතිව කායික, වාචසික, මානසික ක්‍රියාවන්හි නිරත වෙයි.**

**කාලච්ඡේද සංඛ්‍යාව :** 02යි.

**ඉගෙනුම් පල :**

- මහා මංගල සූත්‍රයේ ඇතුළත් මංගල කරුණු පැහැදිලි කරයි.
- නිවැරදි දැක්මකින් යුතු ව කායික, වාචසික හා මානසික ක්‍රියාවන්හි නිරත විය යුතු බව පිළිගනියි.
- මහා මංගල සූත්‍රයේ ඇතුළත් මංගල කරුණු ජීවිත අවදි අනුව වැදගත් වන ආකාරය වගු ගත කරයි.
- යහපත් කායික වාචසික හා මානසික චර්යාවන්හි යෙදෙයි.
- ආධ්‍යාත්මික සුඛය අත්විඳියි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස් :**

මහා මංගල සූත්‍රය ඇසුරින් ලෞකික ලෝකෝත්තර දියුණුව සඳහා නිවැරදි දැක්මක් ඇතිව කායික, වාචසික, මානසික ක්‍රියාවන්හි සිසුන් නිරත කරවීම මෙම පාඩමෙන් අපේක්ෂිත ය.

**පියවර 1 :**

- ජ්‍යොතිෂයෙහි සඳහන් සූනත් ඇඟ වැටීමේ පලාපල ගැන විමසමින් පහත සඳහන් කරුණු ඇතුළත් වනසේ සාකච්ඡාවක් මෙහෙයවන්න.
  - සුභ අසුභ නිමිති පිළිබඳ විවිධ විශ්වාස ආදී කාලයේ සිට සමාජයේ පැවත එන බව
  - ශ්‍රී ලාංකිකයා තුළ අදත් එවැනි විශ්වාස ඇති බව
  - සුභ නිමිති බුද්ධ කාලයේ දී මංගල කරුණු ලෙස සැලකූ බව

**පියවර 2 :**

- සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කොට ගවේෂණ පත්‍රිකා බෙදා දී, අදාළ ක්‍රියාකාරකමෙහි නිරත කරවන්න.

**පියවර 3 :**

- කණ්ඩායම් අනාවරණ පන්තියට ඉදිරිපත් කිරීමට හා ඌන පූරණ හෝ සංවර්ධනාත්මක යෝජනා සඳහා සිසුන්ට අවස්ථාව ලබා දෙමින් පහත සඳහන් කරුණු ද මතු කරමින් සමාලෝචනයක යෙදෙන්න.
  - බුද්ධ කාලයේ දී මංගල කරුණු පිළිබඳ පැවති මතභේද නිරාකණයට මහාමංගල සූත්‍රය දේශනා කළ බව
  - මහා මංගල සූත්‍රයේ මංගල කරුණු 38ක් ඇතුළත් බව

- මහා මංගල සූත්‍රයේ බාල, තරුණ හා මහලු යන ජීවිත අවධි සියල්ලට අදාළ කරුණු ඇතුළත් බව
- මංගල කරුණු පිළිපැදීමෙන් ශිෂ්‍යයකුගේ අනාගතය මනාව සකස් වෙන බව.
- මංගල සූත්‍රයේ අන්තර්ගත කරුණු පිළිපැදීමෙන් පුද්ගලයෙකුගේ ලෞකික හා ලෝකෝත්තර දියුණුව සැලසෙන බව

**ගුණාත්මක යෙදවුම්** : මෙම ගුරු මාර්ගෝපදේශයේ උපදෙස් පිළිපදිමින් ගුරුභවතාගේ අභිමතය පරිදි යොදා ගත හැකි ය.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

නිපුණතා මට්ටමට අදාළ ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණ මැන බැලීමට සුදුසු ආකාරයේ නිර්ණායක සකස් කර ගැනීමට ගුරු භවතාට නිදහස ඇත.

**ගවේෂණ පත්‍රිකාව** :

කණ්ඩායම 1. මහා මංගල සූත්‍රයේ මංගල කරුණු බාල, තරුණ, වැඩිහිටි ජීවිත අවධි අනුව වැදගත් වන ආකාරය පැහැදිලි කරන්න.

කණ්ඩායම 2. ලෞකික හා ලෝකෝත්තර දියුණුව සඳහා මංගල කරුණු වැදගත් වන ආකාරය පෙන්වා දෙන්න.

කණ්ඩායම 3. පුද්ගලයෙකුගේ කායික, වාචසික හා මානසික දියුණුවට මංගල සූත්‍රය උපකාරී වන ආකාරය පැහැදිලි කරන්න.

**ගෙදර පරිසරයෙන්** :

නිවසෙහි දෛනික බුද්ධ වන්දනාව අවසානයේ දරුවන් සමඟ මහා මංගල සූත්‍රය සජ්ඣායනා කර, දිනකට එක් මංගල කරුණක් බැගින් සාකච්ඡාවට ගන්න.

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමෝපාය**

බුදුරජාණන් වහන්සේ ධරමාන සමයෙහි ම භාවිත කොට නිශ්චිත ප්‍රතිඵල විධිමත් ව ලබාගත් ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමවේදයක් අප සතු ව ඇත. බුද්ධ ධර්මය විෂය ඉගැන්වීමේ ක්‍රමවේදය තීරණය කිරීමේ දී සිසු නිපුණතා සංවර්ධනය වන පරිදි සැලසුම් සම්පාදනයට වැඩි අවධානයක් යොමු කර ඇති නිපුණතා පාදක අධ්‍යාපන ක්‍රමයේ දී ගුරු භූමිකාවේ සුවිශේෂ වෙනසක් තුළින් ප්‍රබෝධාත්මක, සක්‍රීය ඉගෙනුම් ක්‍රියාවල යෙදෙන ඉගෙනුම්ලාභීන් ඔවුන්ට කේන්ද්‍ර ගත වූ ක්‍රියාවලියකට නිසැක වශයෙන් ම පත්වනු ඇත.

දැනට පන්ති කාමරයේ ක්‍රියාත්මක වන ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමවේදය සිසු - සිසු අන්තර් සම්බන්ධතා සංවර්ධනය වන අයුරු සකස් විය යුතු වේ. සරලත්වයෙන් සංකීර්ණත්වයට, සංයුක්ත දෙයින් වියුක්ත දෙයට සිසුන් යොමු කිරීම ගුරුවරයාගේ කාර්යය වේ. මෙහිදී ගුරු භවතා සම්පත්දායකයකුගේ තත්වයෙන් ක්‍රියා කිරීම අත්‍යවශ්‍යයි. ඉගෙනුම් පරිසරය සැලසුම් කිරීම, සිසුන්ගේ ඉගෙනුම් නිරීක්ෂණය, ශිෂ්‍ය දක්ෂතා හඳුනා ගැනීම, ඉදිරි පෝෂණ හා ප්‍රතිපෝෂණ ලබාදීම මෙන් ම පන්ති කාමරයෙන් බැහැරට ඉගෙනුම ව්‍යාප්ත වන අයුරු කටයුතු සංවිධානය ගුරුභවතාගෙන් ඉටු විය යුතු මූලික කාර්යයන් වේ.

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ දී පරිණාමන ගුරු භූමිකාව ගුරුවරයා වෙතින් ප්‍රදර්ශනය විය යුතු ය. විෂයමාලා ප්‍රතිසංස්කරණය යටතේ ඉදිරිපත් කරනු ලබන මෙම විෂයමාලාව හා සම්බන්ධ ඉගෙනුම්- ඉගැන්වීම් ක්‍රමවේදය සංවර්ධනය කිරීමේ දී පරිණාමන ගුරු භූමිකාවට අමතරව, සම්ප්‍රේෂණ හා ගනු දෙනු භූමිකාවන්හි ඇතුළත් වැදගත් ලක්ෂණ භාවිතයට ගැනීමට ද ගුරුභවතා සමත් විය යුතු ය.

බුද්ධ ධර්මය විෂය මගින් ධර්මය ආත්මීකරණය කොට දැහැමි ක්‍රියාකාරකම් මාලාවක් ජීවිත උරුමයක් සේ සම්පාදනය කිරීම සඳහා ගුරු දායකත්වය මහෝපකාරී වේ. එහි දී ධර්මයට අනුගත ව ජීවත්වීමේ අවශ්‍යතාව ප්‍රකටව සාකච්ඡා කෙරුණ ද, එය ජීවිත අත්දැකීමක් බවට පත්කර ගැනීම දකින්නට ලැබෙන්නේ අඩු ප්‍රතිශතයකිනි. ඒ නිසා පන්ති කාමරයේ ඉගැන්වෙන බුද්ධ ධර්මය විෂය අන්තර්ගතය, ඉන් බැහැර සමාජයේ දී ද සිය ජීවිතයට චරිතායනය කර ගැනීමට ශිෂ්‍ය ප්‍රජාවට මග පෙන්වීම අත්‍යවශ්‍ය ය. ඒ සඳහා යොමු විය හැකි ක්‍රමෝපායයන් කිහිපයක් මෙසේ දැක්විය හැකි ය.

- නිවසේ ආගමික වත් පිළිවෙත් හි නිරත කරවීම.
- පාසලෙහි ආගමික වතාවත්වලට ක්‍රියාකාරී ව සහභාගිවීමට සැලැස්වීම.
- බෞද්ධ උත්සවයන්හි දී ආමිස පූජාවන්හි මෙන් ම ප්‍රතිපත්ති පූජාවෙහි වැඩි නැඹුරුවකින් නිරතවීමට විධිවිධාන යෙදීම.
- පාසල අයත් ප්‍රදේශයේ හෝ ශිෂ්‍යයා පදිංචි ප්‍රදේශයේ හෝ විහාරස්ථාන ඇසුරින් ආගමික කටයුතුවල නිරතවීමට මග පෙන්වීම.
- දහම් පාසල් අධ්‍යාපනයට නැඹුරු කරවීම.
- වැඩිහිටි නිවාස, රෝහල් ආදියේ උපස්ථාන කටයුතු හා ශ්‍රමදාන කටයුතුවලට යොමු කිරීම.

- පරිසරයේ වටිනාකම තේරුම් ගෙන ඒ අනුව කටයුතු කිරීමට සැලැස්වීම.
- සමාජ සුභසාධන ස්වේච්ඡා සමිති සමාගම්වලට සහභාගීවීමට හා ඒවායේ නිලතල දැරීමට උනන්දු කරවීම.

මේ ආදි ක්‍රමෝපායයන් මගින් පන්ති කාමරයේ ලබන ඉගෙනුම, ජීවිත අත්දැකීමක් බවට පත්කර ගැනීමට අවස්ථාව ලැබෙන අතර, එමගින් තහවුරු කර ගත හැකි සාරධර්ම චරිතායනය කර ගැනීමට අවස්ථාව සැලසේ. ඒ සඳහා ශිෂ්‍යයා යොමු කරවීම බුද්ධ ධර්මය විෂය උගන්වන ගුරු භවතාට පැවරෙන වැදගත් යුතුකමක් ද වේ.

## පාසල් ප්‍රතිපත්ති හා වැඩ සටහන්

1. සැම පුර පසළොස්වක පෝය දින හෝ එම පෝයට පෙර දින හෝ සුවිශේෂ වූ ආගමික උත්සව සංවිධානය කිරීම.
2. පාසලේ / විහාරස්ථානයේ ස්වාමීන් වහන්සේලාගේ අවවාද අනුශාසනා ආගමික කටයුතුවලදී ලබා ගැනීම.
3. ආගමික වතාවත් ඉටු කිරීමේ දී ශිෂ්‍යයන්ගේ හැකියා සඳහා ප්‍රමුඛත්වය ලබා දීම.
4. සහයෝගය, සාමූහිකත්වය, අන්‍යෝන්‍ය ගෞරවය සුහද බව තහවුරු වන පරිදි ප්‍රායෝගික ක්‍රියාකාරකම් සැලසුම් කිරීම.
5. බෞද්ධ ශිෂ්‍ය සමිති පිහිටුවීම සහ ඒ මගින් ආදර්ශවත් නායකත්වයක් පුහුණු කිරීම.
6. අධ්‍යාපන චාරිකා, පර්යේෂණ ව්‍යාපෘති, දැනුම මිනුම තරග, චිත්‍ර ප්‍රදර්ශන, බිත්ති පුවත්පත්, වාර ප්‍රකාශන ආදී ක්‍රියාකාරකම් මගින් වැඩසටහන් සංවිධානය කිරීම.
7. දෙමාපියන් දැනුවත් කිරීමෙන් ශිෂ්‍ය හැකියා සංවර්ධනය කිරීම.

## තක්සේරුව හා ඇගයීම

1. වාර අවසාන පරීක්ෂණ ඇසුරින් විෂය පිළිබඳ ශිෂ්‍ය සාධනයෙ හි විධිමත් ඇගයීමක් අපේක්ෂා කෙරේ.
2. සැම පාඩමක දී ම ශිෂ්‍යයන්ගේ සාධනය පිළිබඳ තක්සේරු කිරීමට/ඇගයීමට විෂය භාර ගුරු භවතා උනන්දුවීම අත්‍යවශ්‍ය ය.
3. ඇගයීම පිළිබඳ ලිඛිත වාර්තා, ලිපිගොනු පවත්වා ගැනීම ද අවශ්‍ය වේ.
4. ප්‍රතිපෝෂණ වැඩ සටහන් සැලසුම් කිරීම ද අපේක්ෂා කෙරේ.
5. ඉගෙනුම හා ඉගැන්වීම දීර්ඝ කිරීම සඳහා ගුරු භවතාට යොදා ගත හැකි අවස්ථා කිහිපයක් පහත දැක්වේ.
   - සංකල්ප සිතියම්, බිත්ති පුවත්පත්, ප්‍රශ්න විචාරාත්මක වැඩ සටහන්
   - ප්‍රශ්න සහ පිළිතුරු පොත්, ශිෂ්‍ය කාර්ය සාධන ගොනු, සිසු නිර්මාණ
   - ප්‍රදර්ශන, විවාද සාකච්ඡා මණ්ඩල, සම්මන්ත්‍රණ, ක්ෂණික කථා
   - භූමිකා රංගන, සාහිත්‍ය විමසුම් ඉදිරිපත් කිරීම, ක්ෂේත්‍ර පොත්
   - ස්වභාව අධ්‍යයන දින පොත්, සාධුචර්යා පුස්තක, ප්‍රායෝගික පරීක්ෂණ